ලංකාදීප
සඳැල්ල
2021 නොවැම්බර් 14



# ගයත්‍රි

ඡායාරූපය - සඳුන් ගමගේ
පිටු සැකසුම - පසන් සෙනෙවිරත්න

# වසරක නිහැඬියාවකින් පසු නන්දා මාලනී සංගීත ආශ්‍රමයට නවක සිසුන්



**දේශයේ දරු පරපුර වෙනුවෙන් "හඳහාමි", "සින්දු හෝඩිය" "පුංචි සින්දු" වැනි නිර්මාණ රැසක් ප්‍රදානය කළ සංගීත විශාරද නන්දා මාලිනිය මෙහෙයවන සංගීත පන්ති සඳහා නන්දා මාලිනී සංගීත ආශ්‍රමයට නවක සිසු සිසුවියන් බඳවා ගැනීම මේ දිනවල සිදු කෙරේ.**

වයස අවුරුදු 8 සිට 12 දක්වා වූ කුඩා දරු දැරියන් සඳහා මූලික ස්වර අභ්‍යාස සහිත දරුවන්ගේ මුවට පහසුවෙන් ගායනා කළ හැකි මධුර ගීත මාලාවක් ඔවුන්ගේ කටහඬ පුහුණුව සඳහාම උගන්වනු ලැබේ.

වයස අවුරුදු 12 සිට 15 දක්වා වූ දරුවන්ට පාසැල් විෂය මාලාව හා සම්බන්ධ කෙරුණු දේශීය ජන ගායනා සහ රාගධාරී විෂය ඇතුළත් සංගීත පාඨමාලාවන්ද තරුණ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා තම ගායනා හැකියාවන් ප්‍රගුණ කර ගැනීම සඳහා ඉන්දියාවේ භාත්ඛන්ඩේ සංගීත විද්‍යාපීඨයේ ප්‍රවේශිකා ප්‍රථම සහ ඩිප්ලෝමා යන පාඨමාලාවක්ද ඉගැන්වේ.

සංගීත ආශ්‍රමය අංක 30, විජයබා මාවත නුගේගොඩ යන ලිපිනයෙන් අයදුම්පත් ලබාගත හැක.


**නර්තනයට**

වයස 16 ට වැඩි තරුණ අය අවශ්‍යයි. දක්ෂතා අනුව ඉහළ ගෙවීම්. දුර අයට ආහාර නවාතැන් ලබාදේ.

077 532 9564
071 669 6486

**සාරානාත්**

හල්ල සහිතව හෝ රහිතව
Flexible Denture New technology
(සාරානාත් ඔප්ටිකල්ස් ආයතනය තුළ)
මාකොළ පාර, කිරිබත්ගොඩ.
Search us on Google : saranath optical and Dental
Tel : 077 67 84 967

**දුරදක්න**

3900/- සිට ඉහළට
www.AsiriDesigners.lk
071-5689207 (9am-5pm)

**වස විස නොමැති ඉලෙක්ට්‍රොනික මීයන් පලවා හරිනය**

www.AsiriDesigners.lk
1790/- සිට ඉහළට
071-5689207 (9am-5pm)
නිවාස සහ වාහන සඳහා...
මී කරදරයට හොඳම විසඳුම.!!

**ඔටිසම්**

ඔටිසම් අධික්‍රියාකාරී ඉගෙනුම් දුබලතා සහිත දරුවන්ගේ ගැටලු සඳහා තනි පුද්ගල ක්‍රියා කාරකම් සඳහා විමසන්න.

071 1475325

විශේෂ අධ්‍යාපන ආචාරිනී සයුරි තන්සරා "ලැබීම" - තංගල්ල



**Jeewaka ස්ලිම් ටී**

සිරුරේ අධික තරබාරුකම අඩුකර සිහින් හැඩැති සිරුරක් ලබාදෙයි.

පැකට් 12 මිල රු. 290/=

- ජීර්ණ පද්ධතිය පහසුකරයි.
- අනවශ්‍ය මේදය තැන්පත්වීම අවම කරයි.
- තුන්දෝස සමනය කරයි.
- පැහැපත් රුවක් ලබාදෙයි.
- ඔබව නිරෝගීව තබයි.



කුරුලෑ • ලප කැළැල • ඉහතන • අනවශ්‍ය රෝම • සම සුදුවීම • විලි සම/කොරල • හොල්, ඇස්වටා, අත්යට, කළුවා කළුවීම

රූපලාවන්‍ය විශේෂඥ බුයන් සමරසිංහ
නුගේගොඩ, මාලබේ, ගම්පහ
0115 633 099
0719 708 672
පැමිණීමට පෙර වේලාවක් වෙන් කරවාගන්න

**ඔබ කෙට්ටුද ?**

ස්ත්‍රී / පුරුෂ දෙපක්ෂයටම

ඔබගේ ශරීරයේ ඇති කෙට්ටු බව නවතා පිරිපුන් පැහැපත් සිරුරක් සඳහා ආරක්ෂාකාරී ප්‍රතිකාර ලබාගැනීමට

නිවසටම ගෙන්වා ගැනීමට හෝ පැමිණීමට

විමසීම් : 0714 520 418

පුරුෂ රෝග - ස්නායු, ධාතු දුබලතා, අප්‍රාණිකත්වය සඳහා විශේෂ ප්‍රතිකාර

අධික තරබාරුව, කාන්තා රෝග, හිසකෙස් රෝග, ගැස්ට්‍රයිටිස්, සියලු රෝග සඳහා පැමිණ හමුවන්න.

**සංහිත ප්‍රතිකාර මධ්‍යස්ථානය**

නො.70, සණස වෙළඳ සංකීර්ණය, නුවර පාර, යක්කල, ගම්පහ.
දිනපතා පෙ.ව 9.00 සිට ප.ව 4.30
W.P.11015

**සිරි සුබ මංගල සේවය**

ඔබ, ඔබගේ දුව, පුතා හෝ මිතුරන් විවාහ අපේක්ෂාවෙන් සිටීද?

අදම අප ආයතනයේ **නොමිලේ ලියාපදිංචි වන්න.**

ඔබගේ තොරතුරු අපවෙත ලබා දීමට මෙම අංකයට මිස් කෝල් එකක් දෙන්න.

076 400 77 90

හඳහන/වයස/තරාතිරම/රැකියාව අනුව ඔබට ගැලපෙන යෝජනා පමණක් තැපෑලෙන් හෝ (Whatsapp / Viber / Imo) මගින් යොමු කරනු ලැබේ.

අප එවනු ලබන යෝජනා ඔබට ගැලපේ නම් පමණක් මුදල් ගෙවීම් සිදුකල හැක.

විවාහයක් වන තුරුම ලියාපදිංචිය වලංගු වේ.

ඔබගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීමට අප බැඳී සිටී.

සිරිසුබ මංගල සේවය
මාගම්මන, හෝමාගම.
074 123 42 44
070 655 77 80

**රෝයල් මංගල සේවය**

Kasade
ROYAL MANGALA SEWAYA

ඔබ, ඔබගේ දුව, පුතා, ඥාතියා හෝ හිතවතා විවාහ අපේක්ෂිතද ?

නොමිලේ ලියාපදිංචි වන්න

මංගල යෝජනා 20,000 ක් අතුරින් ඔබට ගැලපෙන යෝජනා, ඡායාරූප හා සියලුම විස්තර සමඟ ඔබගේ ජංගම දුරකථනයට එවනු ලැබේ. පහත අංක වලට අමතන්න

071 32 23 330
076 98 37 098
077 02 21 599

වසර 12 අත්දැකීම් තුළින් අතිවිශිෂ්ඨ සේවාවක්....
විවාහය වනතුරුම ලියාපදිංචිය වලංගු වේ

රෝයල් මංගල සේවය - මහනුවර
ROYAL MANGALA SEWAYA, KANDY
ශාඛා - පුලතිසිපුර
රජයේ ලියාපදිංචි ආයතනයකි
ලියාපදිංචි අංකය - POL/TKD/ESD/02/02 5560

**ජයදද මංගල සේවය**

JAYADADA MANAGALA SEWAYA

ඔබ, ඔබගේ දුව හෝ පුතා විවාහ අපේක්ෂිතද ?

අප ආයතනයේ ලියාපදිංචි වී ඇති මංගල යෝජනා 10,000 ක් අතරින් තෝරා ගන්න.

**නොමිලේ ලියාපදිංචි වෙන්න.**

යෝජිතයාගේ තොරතුරු හා උපන් වෙලාව පවසා නොමිලේ ලියාපදිංචි වීමට

077 89 99 322 අංකයට මිස් කෝල් එකක් දෙන්න.

ඔබට ගැලපෙන යෝජනා තැපෑලෙන් එවනු ලැබේ.
අප එවන යෝජනා වලට ඔබ කැමති නම්, මුදල් ගෙවන්න.
විවාහයක් වෙනතුරුම ලියාපදිංචිය වලංගුය.

071 9119454, 070 5252984, 070 6600610

ජයදද ආයතනය
අංක 62/4C, සීලරතන මාවත, හොරණ.
(ආයතනය ඉරිදා වසා ඇත.)


# සමහරු දැහැමිට වෛර කරනවා

# නපුරු වුණේ අමාරුවෙන්

## ගයාත්‍රි රාසිංගොල්ල

**ගයාත්‍රි රාසිංගොල්ල, ඇයගේ නාමයයි. සුන්දර ගයාත්‍රි උපන්නේ ඓතිහාසික සෙංකඩගල හෙවත් මහනුවර නගරයේදීයි. නමුත් ඇය හැදී වැඩුණේ, එක්සත් අරාබි එමීර් රාජ්‍යයේදීය. මූලික අධ්‍යාපනය පවා ඇය ලැබුවේ එහිදීය. ඉනික්බිතිව නැවත ලංකාවට ආ ඇය මහනුවර හිල්වුඩ් බාලිකාවෙන් පාසල් අධ්‍යාපනය හමාර කොට, ඕස්ට්‍රේලියාවට ගොස් උසස් අධ්‍යාපනයේ නියැලී ව්‍යාපාර කළමනාකරණය පිළිබඳව Bolton සරසවියෙන් උපාධිය ද මනෝවිද්‍යාව පිළිබඳව Master of Science උපාධිය Roehampton සරසවියෙන් ලබාගත්තාය. රූව ගුණ නැණ ඇති මේ ගයාත්‍රි මානසික සෞඛ්‍ය අංශයේ උපදේශිකාවක ලෙස කටයුතු කරන අතරේ රංගන ශිල්පිනියක ලෙසද කටයුතු කරන්නීය. ප්‍රියන්ත කොළඹගේ නිර්මාණය කළ සකුගේ ලෝකය ටෙලිනාට්‍යයේ දැහැමිගේ චරිතයට දායකව සිටින්නේ ඇයයි. රූව ගුණ නැණ පිරි ගයාත්‍රි එක්ක අපි ලස්සන පිළිසඳරක යෙදෙමු.**





**• ගයාත්‍රි ලංකාවේ ඉපදිලා එක්සත් අරාබි එමීර් රාජ්‍යයට ගියේ මොන වයසේදීද?**

එතකොට මගේ වයස මාස 8 ක් කියලා අම්මා කිව්වා. අපෙ අප්පච්චියි අම්මයි සේවය කළේ එහේ. ඒ නිසා මගේ පාසල් ගමන පටන්ගන්න වුණේත් එහිදී. හය වසරෙන් පසුව නැවත ලංකාවට ඇවිත් හිල්වුඩ් බාලිකාවෙන් ඉගෙන ගත්තෙ. ඉන්පස්සෙ ආයෙමත් අධ්‍යාපන කටයුතුවලට එක්සත් අරාබි එමීර් රාජ්‍යයට ගියා. පසුව ඕස්ට්‍රේලියාවට ගිහින් සරසවි අධ්‍යාපනයේ නියැලුණා.

**• ළමාවියේ UAE (එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ) ගත කළ විදිය ගැන සිහිපත් කළොත්?**

එහේ හරියට මට මගේ ගෙදර වගෙයි. මොකද බහ තේරෙන වියේ ඉඳලා හිටියෙ එහෙනෙ. ජීවිතේ මෙතෙක් වැඩිපුර කාලයක් ගත කළේ එහේ. මගේ පාසල් ගමන පටන්ගත්තෙ එහේ. මට මුලින්ම යාළුවෝ හමුවුණේ එහිදී. විවිධ රටවල විවිධ යාළුවො හිටියා. ඇත්තටම එහි ගතකළ ජීවිතය හරිම සුන්දරයි.

**• ඉගෙනීම් කරද්දී මොනවගේ අරමුණක්ද තිබුණේ?**

O/L සහ A/L කළේ වාණිජ අංශයෙන්. අරමුණ වුණේ බැංකු ක්ෂේත්‍රයෙන් ඉදිරියට යාමට. හැබැයි ඊට පස්සෙ උපාධිය අරගෙන රැකියාවකට ගියා. ඒ රැකියාව කරන අතරතුරේදී මිනිස්සු එක්ක ගනුදෙනු කරද්දි තමයි මිනිස්සුන්ගෙ ප්‍රශ්න එක්ක ඒවට විසඳුම් ලබාදෙන එක ඊට වඩා හොඳයි කියලා හිතුවෙ. එහෙම හිතලා මනෝවිද්‍යාව අංශයෙන් මාස්ටර්ස් එක කළා.

**• පවුලේ ගයාත්‍රි විතරද?**

ඔව්, මම එකම දරුවා.

**• ගයාත්‍රිගෙ අම්මයි අප්පච්චියි මොනවද කරන්නෙ?**

අම්මා ටීචර් කෙනෙක්. අප්පච්චි ටෙලිකොම් අංශයේ, ඉංජිනේරු අංශයේ සේවය කළේ. දැන් දෙන්නම විශ්‍රාමිකයි.

**• වෙනම අංශයක් ගැන හිතපු ගයාත්‍රි කොහොමද කලාවට එන්නෙ?**

ළමා කාලයේ ඉඳලාම බටහිර සංගීතය ඉගෙන ගත්තා. පාසල් සමයේදී නාට්‍ය, නර්තනය, ක්‍රීඩා ඇතුළු බොහෝ දේට දයක වුණා. කලාවට සමීප දේ කුඩා කාලයේ ඉඳලම තිබූ දෙයක්. රඟපෑමට හිත ගියේ ගිය අවුරුද්ද දක්වා ඕස්ට්‍රේලියාවේ අධ්‍යාපනය ලබමින් සිටියදීයි. උපාධිය ලබාගෙන එහි සරසවියක සේවය කරන අතරේදී, රංගනය පිළිබඳව වැඩමුළුවකට සහභාගි වුණා. රඟපෑම ගැන ලොකු උනන්දුවක් ඇතිවුණේ එතැනදී. ලංකාවට ආවට පස්සෙ සකුගේ ලෝකයට අලුත් ළමයෙක් සොයන බව දැනගත්තාම බඳවා ගැනීමේ පරීක්ෂණයට මාත් සහභාගි වුණා. මට පුළුවන් විදියට එද ඉදිරිපත් කිරීම කළා. පසුව ප්‍රියන්ත කොළඹගේ සර් සහ අජිත් ලොකුගේ සර් කතා කරලා මාව තෝරාගත්තා කියලා කිව්වා.

**• ඊට කලින් රඟපාලා තිබුණෙ නැද්ද?**

පාසලේදී නාට්‍ය සහ කලා අංශයේ ඉසව්වලට දයකවෙලා තිබුණා. ටෙලිවිෂන් මාධ්‍යයේ ඉඳලා නැහැ. අම්මයි අප්පච්චියි මගේ කරන කියන දේවලට උදව් කරනවා.

**• සකුගේ ලෝකයේ දැහැමි හරිම නපුරුයි. කොහොමද ඔච්චර නපුරු වුණේ?**

ඒ නපුරුකම ගන්න මට ගොඩක් අමාරු වුණා. මොකද සැබෑ ජීවිතයේදී මම එහෙම කෙනෙක් නෙවෙයි. වෘත්තීය වශයෙන් මම අද නියැලී සිටින්නෙ මානසික සෞඛ්‍ය අංශයේ. උපදේශනය කරන්නෙ. නපුරු චරිතයක් කරන්න ලැබීම අභියෝගයක්. ඒ චරිතය කරන්නට මට මගේ වෘත්තියේදී හමුවූ එක් එක් මිනිසුන් වෙතින් දුටු ස්වභාවයන් ඉවහල් වුණා.

**• නම දැහැමි වුණාට කරන වැඩ දැහැමි නැහැ?**

ඔව්, කතාව ඇතුළෙත් ඒ ගැන කියැවෙනවා.

**• කොහොමද දැහැමිට ලැබෙන ප්‍රතිචාර?**

සමහරු මේක චරිතයක් විතරයි කියලා දැනගෙන රංගනය හොඳයි කියන ප්‍රතිචාර ලබාදෙනවා. තව කොටසක් හිතන්නෙ ඒක මගේ පුද්ගලික ජීවිතය කියලයි. ඒ නිසා වෛර කරනවාත් ඇති.

**• ඒ විදියට හොඳට සහ නරකට හිතන හැමෝටම දැනගන්න සැබෑ ජීවිතයේදී ගයාත්‍රි මොන වගේ කෙනෙක්ද කියලා කියමු?**

මම බොහොම සංවේදී කෙනෙක්. ඒක මගේ ස්වභාවය. යම්කිසි දෙයක් වුණොත් මුලින්ම මම බලන්නෙ මගෙන් සිදුවූ වැරැද්ද මොකද්ද, අඩුපාඩුව මොකක්ද කියලයි. බුද්ධ ධර්මය, මානසික විද්‍යාව ගැන හිතන්න කතා කරන්න කැමති කෙනෙක්. බාහිරව දකින පෙනෙන දේ ගැන කතා කරන්න එච්චර කැමති නැහැ. ඒ වගේ අවස්ථාවලදී මම නිහඬව ඉන්නෙ මට කතා කරන්න දෙයක් නැති නිසයි.

**• දැහැමි වෙච්ච ගයාත්‍රිගෙ ආදරේ මොනවගේද? ආදරය ගැන හිතන්නෙ මොන විදියටද?**

බොහෝ වෙලාවට බොහෝදෙනා හිතන්නෙ ආදරය කියන්නෙ මගේ තමන්ගෙ වෙන කාටවත් අයිති නැහැ, ඒ නිසා මටම අයිතිකර ගන්නවා වගේ දෙයක්. ඔයා මගේ නම් මම ඔයාගෙ නම් අපි මෙහෙම ඉමු කියලා දෙන්නාට දෙන්නා වාරණ දගෙන එක රාමුවක හිරවෙනවා. මම ආදරය ගැන හිතන්නෙ ඒ විදියට නෙවෙයි. දෙදෙනාට දෙදෙනා තේරුම් අරගෙන අනෙකාට යායුතු දුර, කරන කියන දේ වෙනුවෙන් උදවු වෙන්න පුළුවන් නම් ඒක හොඳ දෙයක්. එහෙම නැතුව එක් රාමුවකට කොටු වෙන්න ඕනෑ නැහැ. යශෝධරාවගෙ ආදරය වගේ දෙයක් තමයි මම සැබෑ ආදරය ලෙස දකින්නෙ.

**• විවාහය කියන්නෙ?**

ඒකත් එක එක්කෙනාට සාපේක්ෂයි. එහිදීත් බොහෝවිට වෙන්නෙ අපට කියාදීපු, සම්ප්‍රදයිකව හෝ එන ක්‍රමවේදයකට නතුව සිස්ටම් එකකට යටත්ව ජීවත්වීමයි. ඇයි අපි විවාහ වෙන්නෙ? කියලා ඇහුවොත් මම හිතන්නෙ ඒකට බොහෝදෙනා ළඟ උත්තර නැහැ. විවාහවීම නොවීම හෝ මහණ වෙනවාද හෝ වෙන දෙයක් කරනවාද යන්න තමාගේම ආධ්‍යාත්මයෙන් ආ යුතු දෙයක්. අනෙක් අයට හානියක් නොවී තමන්ට ඕනෑ විදියට ජීවත්වීම හොඳ බවයි මගේ හැඟීම.



**• රඟපෑම ගැන අද ගයාත්‍රිට දැනෙන්නෙ කොහොමද?**

එක දවසක් එක් සීන් එකක රඟපාන්න එක ඔෆිස් එකක දින තුනක් වැඩ කළා හා සමානයි. ඒ වගේ වෙහෙසක් දැනෙන්නෙ. රඟපාන කෙනාට විතරක් නෙවෙයි නිර්මාණයකට සම්බන්ධ මුළු කණ්ඩායමටම ඒ වෙහෙස දැනෙනවා. ඒ නිසා ඒ මහන්සිය සහ කැපවීම දරාගෙන රඟපෑම කරන්න නම් ඒකට ලොකු කැපවීමක් කරන්නම වෙනවා.

**• මෙතැන් සිට ගයාත්‍රිගෙ අරමුණ දිගටම රඟපෑමද?**

සකුගේ ලෝකයට අමතරව තවත් වැඩ දෙක තුනකට ආරාධනා ලැබී තිබෙනවා. ඒ අතරේ මගේ වෘත්තියට අදාළව කටයුතුත් කරනවා. රඟපෑමෙන් මට තෘප්තියක් තියෙනවා වගේම, උපදේශනය වෙතින් මිනිසුන්ට යමක් වටහලා දීලා සේවයක් වෙනවා කියලා මම හිතනවා.

**• ගයාත්‍රි උපන් රටට හැමෝම කැමතියි, ඒ හැර එක්සත් අරාබි එමීර් රාජ්‍යයටද කැමති, ඕස්ට්‍රේලියාවටද කැමති? ඒත් නැතිනම් සංචාරය කළ වෙනත් රටකටද කැමති?**

මගේ රට, UAE වලට සහ ඕස්ට්‍රේලියාව යන රටවල් තුනම මට විශේෂයි. ඒ අතරින් ප්‍රාථමික ළමාවිය ගතකළ UAE (එක්සත් අරාබි එමීර් රාජ්‍යයට) මම වැඩිපුර කැමතියි. අපි හිටියෙ UAE වල අල්ෆුජෙයිරාවල. එහේ හරිම ලස්සනයි. අල්ෆුජෙයිරාවල මම නොදන්නා තැනක් නැති තරම්. මගේ යාළුවෝ, මම හැදී වැඩුණු තැන නිසා එතැනට වඩා ආසයි. ඒ වගේම ඕස්ට්‍රේලියාව මිනිසුන්ගෙ සමාජ රටාවට, එනම් අනෙක් අයට කරදරයක් නැතුව තමන් ජීවත්වන විදියටත් මම ආසයි.

සටහන/ඡායාරූප: සඳුන් ගමගේ



# සුදත් රෝහණ

# වැවක් රැකෙන්නේ වෑ කන්දෙන්

**ශ්‍රී ලාංකීය කලා කෙත අස්වැද්ද වීමට සාර බාර වටිනා නිර්මාණයන් දායාද කළ තවත් අසුරු කලාකරුවෙකු ලෙසට ඔහු ගෞරවයෙන් හඳුන්වා දිය හැකිය. දක්ෂතා රැසකින් පරිපූර්ණ සුදත් රෝහණ නම් සොඳුරු ටෙලිනාට්‍ය අධ්‍යක්ෂවරයා සොයා අපි රූපවාහිනී මහගෙදරට ගොඩ වුවෙමු. එම මාධ්‍ය ජාලයේ සභාපතිත්වය දරන ඔහු දහසකුත් එකක් වැඩ රාජකාරී මධ්‍යයේ අප අරාධනාව භාරගත්තේය.**

**• ක්ෂේත්‍ර ගණනාවකම නිපුණත්වයෙන් පිරිපුන් කෙනෙක් ඔබ. මා ඇමතිය යුත්තේ කෙසේද කියලයි කල්පනා කළේ.**

තනතුරුනම් තාවකාලිකයිනේ. නමුත් මනුස්සකම්, පොළොවේ පය ගහලා ඉන්න ප්‍රතිපත්තිය හැමදාම තියෙන කෙනෙක්. ඔබ අවශ්‍ය විදිහට කතා කරගෙන යන්න.

**• මේ දිනවල මොනව ද ඔබේ අලුත් වැඩ කටයුතු.**

ITN රූපවාහිනී සමාජ ජාලයේ සභාපතිත්වය දරනවා. ඊට අමතරව අවුරුදු 8කට පස්සේ අලුත් ටෙලිනාට්‍යයක් කරන්න මුල පිරුවා. බොහෝම ජනප්‍රිය නවකතාවක් ඔස්සේ.

**• ඔබේ නිර්මාණ කරනය අන් අයට වඩා වෙනස්.**

ඔව්... සමහර විට.. සාහිත්‍ය රසය පිරිණු කලා නිර්මාණයක් ටෙලි නාට්‍යයකට හැරවීමෙන් මහා විශාල පිරිසක් එහි ග්‍රාහකයන් බවට පත්කර ගත හැකියි. නවකතාව රස විඳි පාඨකයා, රූපමය නාට්‍යයක් ඔස්සේ සාරවත් කරන දේ සොයා යන ප්‍රේක්ෂකයෙක් බවට පත්වෙනවා. යහපත් සමාජයක් ගොඩ නැගීමට විශිෂ්ට රසවින්දනයක් අත්‍යවශ්‍යයි. විශේෂයෙන්ම තාක්ෂණයේ කෙළවරටම ගිය වකවානුවක, සාරවත් නිර්මාණයක් සමාජ ගත කිරීම සැබෑම අභියෝගයක්. මේ අභියෝගය එදා සිට අද දක්වාම මම සිනමාව, රූපවාහිනිය වේදිකාව හා නිර්මාණ ඉදිරිපත් කර මා ජය ගත්තා.

**• පුංචි කාලේ කවුරු වෙන්න ද කැමැත්තෙන්ම හිටියේ.**

පාසල් වේදිකාවේ ළමා නළුවෙක් ලෙසට ප්‍රසිද්ධ වෙනවාත් සමඟ කවද හරි මම දක්ෂ කලාකරුවෙක්. වෙනස්ම ආකාරයේ නිර්මාණකරුවෙක් වෙනවා කියලා නිතර හිතුවා. ආසාවේ ප්‍රතිඵලයක් ලෙසටයි බස් එකේ යන්න සල්ලි හොයාගෙන සිනමාව ගැන උගන්නන පාඨමාලා හදාරන්න පෙලඹුණේ. දැනුම සොයා යන ගමනේදී රැවටුණ අවස්ථාත් ඕනෑ තරම් තිබුණා.

# කොහේ ගියත් අඳින්නෙ සරම







# රහස්

කට්ටක් කාලා ආපු ගමනක්.

අප අපගේ දක්ෂතාවයෙන් ගමනක් යනවා නම් කටු කියන්නේම අභියෝග.

අද ආපසු හැරිලා බලද්දී මට හිතෙන්නේ වෘත්තිය මට්ටමෙන් යම් පළදයි දෙයක් කරන්න ජීවිතේ මුහුණ දුන්න අනේක විද අභියෝග අද මටම ආශිර්වයක් වෙලා කියලා.

කලාකරුවෙකු ලෙස ඔබේ නිර්මාණකරණයේ ඇති වෙනස.

කලාකරුවකු නිතරම සමාජයේ පෙර ගමන්කරුවෙකු විය යුතුයි. හෙට වෙන දේ අද දැකිය යුතුයි. පොදු සමාජයේ මත, ආකල්ප, හැසිරීම්, ස්පර්ශ කළ යුතුයි. මා විසින් කළ සෑම නිර්මාණයකම, අධ්‍යක්ෂකව තිර නාට්‍ය රචනයකට මේ හැම දේම ගැබ් කරන්න මා උත්සාහ ගත්තා කියලා.

**• ඔබට හිතෙන විදිහට ඔබ වඩාත් ජනප්‍රිය වන්නේ.**

මන්දරම් ටෙලිනාට්‍යයේ සිට ගිරිකුල ටෙලිනාට්‍ය දක්වා ප්‍රේක්ෂකයාගේ ආදරණීය ගෞරවය වැඩි වුණා.

**• රසික, ප්‍රේක්ෂක අගය කිරීම් කොහොම ද දැනෙන්නේ ඔබට.**

ජනතා ගෞරවයට, ආදරයට පාත්‍ර වෙනවා කියන්නේ ඒක වචනයෙන් විස්තර කරන්න බැරි උත්තේජනයක්. විශිෂ්ට ගනයේ නිර්මාණ දෙකොත් මුදුනින් පිළිගන්න රසික හදවත් අදටත් සිටිනවා. එවැන්නියගේ අගය කිරීම්, තව තවත් නිර්මාණ බිහි කිරීමට මඟ පෙන්වනවා. විශේෂයෙන්ම රසිකයන්, කලාකරුවන් අගය කරන්නේ ඔහුගේ කලා නිර්මාණ වැළඳගන්න.

**• ජීවිතය ගැන මොකද හිතෙන්නේ.**

ජීවිතයේ විවිධ වයස්කාණ්ඩ පසුකරගෙන යනකොට ජීවිතය විවිධ විදිහට දැනෙනවා. තරුණ අවධියේ සෙල්ලක්කාරව දැක්ක ජීවිතේ මුහුකුරා යන කොට පරිනත වෙනකොට විවිධ විදිහට පේනවා. දකිනවා. මේ කොයි විදිහෙන් බැලුවත් ජීවිතය කියන්නේ හරිම අනිත්‍ය දෙයක් කියලා නම් නිතර දැනෙනවා.

**• ආදරය ජීවිතයට අත්‍යවශ්‍ය දෙයක් විදිහට ඔබට හිතෙනවා ද?**

වැවක් රැකෙන්නේ වෑකන්දෙන් වගේ ජීවිතයක් සුරක්ෂිතව රැකෙන්නත් ආදරයක් අවශ්‍යයි. උපන්දා සිට මියැදෙනකම්ම ජීවිතවලට අත්‍යවශ්‍ය දෙයක් ආදරය.

# 'කටු' කියන්නෙ අභියෝග

**• ඔබේ කලා ජීවිතයට මුණ ගැසුණු වටිනාම පුද්ගලයා.**

තිස්ස අබේසේකරයන්ගේ මඟ පෙන්වීම, ගුරුහරුකම් අද මා ඉන්න තැනට විශාල පිටුවහලක් වුණා. ඒ මතකය සැම ද අමරණීයයි.

**• විනෝදාංශ විදිහට මොනව ද ඔබ අතින් කෙරෙන්නේ.**

පොත්පත් කියවීමට බොහෝම ප්‍රිය කෙනෙක් මම. ඊට අමතරව ලෝකයේ විවිධ රටවල වෙනස්ම ආකාරයෙන් නිර්මාණය කළ චිත්‍රපට නරඹන්නත් බොහෝම ප්‍රියයි. සංගීතය රසවිඳීමත් සතුටින් කරනවා.

**• නිරෝගිකම ආරක්ෂා කරන ගන්න මොනවා හරි කෙරෙනවාද?**

අමුතුවෙන්ම මොකුත් කරන්නෑ. නමුත් ජීවිතය විඳින්න, සතුටින් ඉන්න මම බොහෝම ප්‍රියයි. කරන වෘත්තීන්වල ස්වභාවයත් එක්ක කන බොන දේවල් ගැන නම් ලොකුවට හිතන්න වෙලාවක් නෑ.

**• ශරීර සුවතාවය වෙනුවෙන් ව්‍යායාම කරනවාද?**

කලා නිර්මාණයකට අත ගහනවා කියන්නේම ගතටයි, සිතටයි, හොඳම ව්‍යායාමක් ලැබෙන අවස්ථාවක්. ඒ හැරෙන්න ඇවිදීම වගේ ව්‍යායාමවල නිරත වෙන්න කාලෙකින් බැරි වුණා.

**• විලාසිතා කරන්න කැමති ද?**

මට ගැලපෙන විදිහට ඇඳුම් අඳින්න ආසයි. සරම ඇඳලා කුර්තා එක ඇඳලා ඉන්න එකම ටෙලිනාට්‍ය අධ්‍යක්ෂවරයාත් මම වෙන්න ඇති. අපේ ශ්‍රී ලාංකීය අනන්‍යතා සරමනේ. ගෙදර හිටියත් රාජකාරී වැඩකට ගියත් විදේශ රටකට ගියත් මම අඳින්නේ සරම.

**• කැමති පාට**

සුදු පාටට කැමතියි.

**• වාසනාව ලැබීම ගැන විශ්වාසය කරනවාද ?**

මෙහෙමයි, ඕනෑම කෙනෙකුගේ දෛවයේ වාසනාව, ලැබීම කියන දේ රැඳිලා තියෙන්න පුළුවන්. නමුත් වාසනාවන්තයි කියලා හිතලා නිකන් බලා හිටියොත් වෙන්නේ තියෙන දේවලුත් නැති වෙන එකනේ. ඒ නිසා උනන්දුවෙන් උත්සාහයෙන් තමන්ගේ දක්ෂතාවයන් හැකියාවන් ඔපදමා ගන්න නිරතුරුව උත්සාහ ගත යුතුයි.

**• ජීවිතයේ වඩාත් සතුටුදායක දවස**

එවැනි අවස්ථා බොහොමයක් තියෙනවා. නමුත් පියෙකු ලෙසින් නිස ඔටුනු පැළඳූ උත්තරීතර සිදුවීම අදටත් හරිම ආදරණීය මතකයක් ලෙසට තියෙනවා.


**• ජීවිතයේ වඩාත් සංවේදී වුණ දවස.**

මා ආ ගමන් මගේ නොසැලෙන ශක්තියක් වුණ. මියැදෙනකම්ම සෙනෙහසේ ආදරයක් අඩු නොවුණ ආදරනීය අම්මාගේ වියෝව අදටත් හදවතට විඩාවක්.

**• බිරිඳගෙන් ලැබෙන සහයෝගය ගැන මතක් කළොත්.**


ඇය මාව මගේ වෘත්තිය තේරුම් නොගන්න අද සුදත් රෝහණ කියලා ඔබ හඳුනන කෙනෙක් නොසිටින්න තිබුණා. සැබැවටම ඇය මගේ ජීවිතය ආලෝකමත් කළ මිණි පහණයි.

අසුන්තා එදිරිසූරිය




# රජිනිකාන්ත් ගේ නවතම චිත්‍රපටියට වහ වැටුණ රසිකයෝ

වයස අවුරුදු 70 ඉක්මවා තිබුණත් තරුණ කල තිබූ රසික ආකර්ෂණය එලෙසින්ම පවත්වාගෙන යන්නට හැකි තරම් වාසනාවක් හිමි නළුවන් සිටින්නේ කිහිප දෙනෙකු පමණකි. දකුණු ඉන්දියානු සිනමාවේ ජයකෙහෙළි නැංවූ රජිනිකාන්ත් මේ අතර ඉදිරි පෙළේම සිටින නළුවෙකි. ඔහුගේ ජනප්‍රියත්වය මොන තරම් ද යත් සිනමා රසිකයන් ඔහු අදහන්නේ දේවත්වයෙනි. ඔහු රඟ පාන චිත්‍රපටියක් තිරගත වෙන බැව් දැන ගත් විට ඔවුහු උද්යෝගයෙන් උමතු වෙති.




දීවාලි උත්සවය වෙනුවෙන් නොවැම්බර් 4 දා තිරගත කරන ලද අන්නාත්තේ චිත්‍රපටියේ ප්‍රචාරක පටය පමණක් කෝටි ගණනක් රසිකයන් විසින් නරඹනු ලැබ තිබුණේ එම නිසාය. චිත්‍රපටිය තිරගත වූ සිනමා ශාලාවල පිටත රසිකයන් පොදි කමින් සිටි අතර ඔවුහු රජිනිකාන්ත් පත්තු කරමින් බල්ලරසන් දෙමින් සිය සතුට පළ කළහ.

ක්‍රියාදාම චිත්‍රපටියක් වන මෙහි රඟ පාන්නේ රජිනිකාන්ත් නයන්තාරා, කීර්ති සුරේෂ් ඇතුළු පිරිසකි. මෙය අධ්‍යක්ෂණය කර ඇත්තේ සිරුතායි ශිවා විසිනි. දෙමව්පියන් අහිමි වූ පසුව අයියා කෙනෙකු සිය නැගණිය බලා හදා ගන්නා ආකාරය සහ ඇයගේ ආරක්ෂාව වෙනුවෙන් දිවි පරදුවට තබා ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ කතාවක් මෙම චිත්‍රපටියට ඇතුළත්ය. කීර්ති සුරේෂ් රජිනිකාන්ත් ගේ නැගණිය ලෙස රඟ පාන්නීය.

අන්නාත්තේ චිත්‍රපටියේ නිෂ්පාදන වියදම රුපියල් කෝටි 180 කි. එහෙත් ඒ වියදම ආවරණය කර ගන්නට දින කිහිපයකට වඩා ගත නොවනු ඇතැයි ආර්ථික විශේෂඥයෝ පවසති. මක් නිසා ද යත් චිත්‍රපටිය තිරගත කර දෙදිනක් ගත වෙද්දීම කෝටි 100 ආදායම් කඩඉම පසු කරන්නට එය සමත්ව තිබූ බැවිනි. ප්‍රථම දිනයේ ආදායම කෝටි 70 ඉක්මවා තිබීණ දෙවන දිනය වන විට එය කෝටි 112. 85 දක්වා ඉහළ නැංගේය. පස් වන දිනය වන විට කෝටි 150 අභිබවා ගියේය.

සිය චිත්‍රපටියට රජිනිකාන්ත් තෝරා ගත් අයෙකු කවදාවත් පසුතැවිලි නොවන්නේ ඔහු ජනතා ආකර්ෂණය නොමඳව ලබන නළුවෙකු බැවිනි. කොරෝනා වසංගත තත්වය සහ මේ දිනවල වෙන්නාවි නගරයට ඇද හැලෙන තද වැසි නොතකා සිනමා ශාලාවල රසිකයෝ පොදි කමින් සිටියහ. ලෝකය පුරා සිනමා ශාලා 1100 ක මෙම චිත්‍රපටිය ප්‍රදර්ශනය වන්නේය. එහෙත් එය විචාරකයන්ගේ ප්‍රසාදයට පාත්‍ර නොවනු ඇතැයි බොහෝ දෙනෙක් කියති.

# රාජ් කුමාර් පත්‍රලේඛාට ලියූ ආදර හසුන්

මේ වන විට රාජ් කුමාර් රාඕ සහ ඔහුගේ දිගුකාලීන පෙම්වතිය පත්‍රලේඛා අතර විවාහයට සියලු කටයුතු සූදානම්ය. ඔවුන්ගේ පෙම් කතාවේ වයස අවුරුදු දහයකි.

රාජ් කුමාර් මොන තරම් ආදරණීය පෙම්වතෙකු ද යත්, සම්බන්ධය පටන් ගත් මුල් දිනවල පටන්ම ඇයට ආදර හසුන් ලියන්නට ඔහු පුරුදුව සිටින්නේය. විශේෂයෙන්ම චිත්‍රපටි රූගත කිරීම් සඳහා දුරට යන්නට සිදු වූ විට ඔහු අනිවාර්යයෙන්ම ඇයට ලියන්නේය. එහෙත් ඇතැම් අවස්ථාවල ඔහු ඒවා ඇයට නොදී තමා ළඟම තබා ගන්නේය. මෙලෙස එකතු කරන ලද ලියුම් මංගල තෑග්ගක් ලෙස ඇයට පිරිනමන්නට ඔහු සූදානමින් සිටින බැව් ඔවුන්ගේ සමීප සගයෙක් පවසා තිබිණි. එය තමාගේ ආදරය අගවන සංකේතයක් වනු ඇතැයි රාජ්කුමාර් කියන්නේය.



ක්‍රිති සැනොන් සමඟ ඔහු රඟ පෑ හම් දෝ හමාරේ දෝ චිත්‍රපටිය මේ දිනවල තිරගත වෙමින් තිබෙන අතර ඔහු ඊ ළඟට තුම් පෙද්නේකර් සමඟ බධායි දෝ චිත්‍රපටියේ රඟ පාන්නට නියමිතය.

# දියා මිර්සා පියා ගැන කතා කරයි

මේ මෑතකදී නිකුත් වූ සඟරාවක දියා මිර්සා ඇගේ පියා ගැන අදහස් පළ කර තිබිණි. ඇගේ පියා ජර්මන් ජාතික චිත්‍ර ශිල්පියෙකු වූ ෆ්‍රෑන්ක් හෙන්ඩ්‍රිච් මිය ගියේ දියා නව හැවිරිදිව සිටියදීය. ඔහුට අයිතිව තිබූ දේවලින් කොටසක් ලබාගෙන සිය නිවසේ තබා ගන්නට තමා තුළ තිබූ ආශාව ගැන ද ඒ ප්‍රකාශයේ සඳහන් වී තිබිණි.




දියාගේ මව දීපා ගෘහ අලංකරණ ශිල්පිනියක වූවාය. ඇය ෆ්‍රෑන්ක්ගෙන් දික්කසාද වූයේ දියා පස් හැවිරිදිව සිටියදීය. ඔහු වෙනත් විවාහයක් කර ගත් අතර ඉන් ඔහුට පුතෙකු ලැබිණි. ඔහුට අයිතිව තිබූ හැම දෙයකම නව අයිතිකරු වූයේ ඒ පුතාය. තමාට ඒවායින් කොටසක් හොයාගැනීමේ හිතේ අමාරුව බොහෝ කාලයක් ඇය පෙළුවේය.

"මීට අවුරුදු කිපෙකට ඉස්සර ඒ මල්ලී මුම්බායිවල මගේ ගෙදරට ආවා.. මම එයාට මගේ ගෙදර හැමතැනම පෙන්නුවා.. එක කොරිඩෝ එකක තියෙන්නෙ ජායාරූප.. ඒවා අතරෙ ම පුංචි කාල අම්මයි තාත්තයි එක්ක ගත්ත ජායාරූපයක් තිබ්බා.. මල්ලි ඒක දිහා ඕනකමින් බලාගෙන ඉද්දිද්දි මට හිතුණා ඒක මිළ කරන්න බැරි එකක් නේද කියලා.. ඊට පස්සෙ තමයි තාත්තගෙ දේවලින් කොටසක් හොයාදීමේ දුක සදහටම මගෙන් ඈත් වෙලා ගියෙ.."

ඇය කියා තිබිණි.

මේ වන විට ඇයත් ඇගේ සැමියා වයිභාව් රාඛිත් පුතෙකුගේ දෙමව්පියෝ වී සිටිති. ඔහුට නම තබා ඇත්තේ අව්යාන් ලෙසිනි.

# බොලිවුඩ්







# ආක්ෂේ කුමාර්ගේ නවතම චිත්‍රපටිය සූර්යවංශී

ආක්ෂේ කුමාර් සහ කත්‍රිනා කායිෆ් රඟපාන සූර්යවංශී චිත්‍රපටිය තිරගත කරනු ලැබුවේ ද දිවාලි උත්සවය වෙනුවෙන් දෙන තිළිණයක් ලෙසිනි. එය ප්‍රදර්ශනය ඇරඹූ දිනයේදීම කෝටි 26. 94 ක ආදායමක් ලැබිය.

"සූර්යවංශී චිත්‍රපටිය තිරගත වුණේ සතුට, බලාපොරොත්තුව, සුබවාදීත්වය, විශ්වාසය ආයෙමත් මතු කරවමින්.."

විචාරකයෙකු පවසා තිබිණි.

අජේ දේව්ගන්, රන්වීර් සිං, ජැකී ෂ්‍රොෆ්, ගුල්ෂාන් ග්‍රෝවර්, අභිමන්යු සිං ආදීහු ද මෙහි රඟ පාති.



චන්දි කොඩිකාර

# සුවඳයිද කොයිතරම් හද අතුල ආදරේ



**ඉර බැස ගියේය. එහෙත් අවන්හලේ වූ විදුලි බුබුළු එකින් එක දැල්වෙන්නට වුණේත් අඳුරක් වූයේ නැත. සුගත් පත්තුවෙන හැම විදුලි බුබුලක් දෙසම බැලුවේ ඒ හැම එකක්ම දැල්වෙද්දී අඳුර පලායන බැවිනි.**

මොකද මචං කල්පනාව?

ඔහු සමඟ සිටි මිතුරා ඇසුවේය.

යන්න කියලා.

සුගත් කීවේය. 'මෙලහටත් චූටි පුතා මඟ බලාගෙන ඇති. අද මට කලින් එන්නත් කිව්වා. පන්සල් යන්න.

මේ මේ විකාරනම් කියන්න එපා.

මිතුරා වහා සුගත්ගේ ඉදිරිපිට වූ වීදුරුව ගෙන මත් වතුර පිරෙව්වේය.

මේක බීපං.

ඒ සමගම ඔහු වේටර් කොලුවාට කතාකර තවත් මාලු බෙඩ්ල් එකක් ගෙනෙන්නැයි කීවේය.

උඹට කියන්න සුගා. මම මේ ලෝකෙ අකමැතිම තැන තමයි ගෙදර ගෙදර හිටියොත් ඒ ඉන්න හැම තත්පරේකම හිත කල කිරෙනවා. මගෙ ගෑනිට මං තරම් වැරැදි කරන මිනිහෙක් මේ ලෝකෙම නැහැ. මටම පුදුමයි මම මෙහෙම බාර් එකක ඉන්න එක ගැන. ගෑනි කියන විදිහට හරිනම් මම ඉන්න ඕනෑ හිරේ. ඒ තරමටම මම වැරැදි. උදේ නැගිටින්න පරක්කු වුණත් වැරැදි. එදාට මට බොන්න තියෙන්නෙ නිව්ච්ච තේ එකක්. තේ එක නිව්ලා මං කිව්වාම ඔන්න පටන් ගන්නවා චූර්ණිකාව. ඊළඟට පොල් ගාන්න කියයි. මං බෑ කිව්වොත් කාගෙ හරි මිනිහෙක්ව උදාහරණයකට ගනියි. අරගෙන ඒ මිනිහගෙ හොඳ වරුණාව කියවන්න ගනී.

එතකොට ගෙදර හිටියොත් මකුලු දැල් කඩන්න කියයි. ගේ මොබ් කරන්න කියයි. තව රටේ නැති එව්වා. ටී. වී. එක බලන්න ගත්තොත් ඒකත් වැරැදි. ෆෝන් එකට කෝල් එකක් ආවත් වැරැදි. ආපු කෝල් එකක් විනාඩි පහකට වැඩියෙන් දිග වුණොත් එතනත් කොස්සා.

මිතුරා කියාගෙන යමින් තවත් මත් වතුර වඩියක් වීදුරුවට දැම්මේය.

ගෙදර ඉන්නදවටත් ඒ වගෙ වැඩක් කරන්න ඕනැ නේන්නම්. ගෙදර අම්මයි තාත්තයි නේන්නම් ගෙදර වැඩ දරුවන්ගෙ වැඩ කරන්න ඕනැ.

සුගත් කීවේය.

කරන්න ඕනැ. කරන්න ඕනැ. නැතුව අල්ලපු ගෙදර මිනිහ ද ඒ වැඩ කරන්නෙ.

මිතුරා කෝපයෙන් ඇසුවේය.

මම කියන්නෙ කොච්චර කලක් කිසිම ඇගයීමක් නැති එක යාලුවෙක් එහෙම ආවොත් ඒකිත් එක්කම මගෙ වැරැදි කියෝනව මිස බැරිවෙලාවත් හොඳක් නම් කියන්නෙ නැහැ.

සුගත් හිස සැලුවේය.

මම දන්න විදිහට මම හිතන විදිහට මේ ලෝකෙ කිසිම ගෑනියෙක් තමන්ගෙ මිනිහගෙ වරදක්ම මිස හොඳක් නම් කියන්නෙම නැහැ.

මිතුරා යළි කීවේය.

මං හරි නේද මචං. උඹේ ගෑනිත් එහෙමනෙ. ඇත්ත කියපං.

මම යනවා මචං.

වහා පුටුවෙන් නැගී සිටි සුගත් අවන්හලෙන් පිටව යන්නට සැරසුණේය.

පලයං ඒත් යන්න කලින් මං අහපු ප්‍රශ්නෙට උත්තරයක් දීලා පලයං.

මිතුරා කීවේ සුගත්ගේ අතින් අල්ලා ගනිමිනි.

හුඟාක් ගෑනු නම් එහෙම තමා හැබැයි එහෙම නොවෙන ගෑනුත් ඇති. ඔය නවකතාවල එහෙම ඒ වගේ ගෑනු ඉන්නෙ. හරියටම හරි මචං

එහෙම මිනිසුන්ගෙ හොඳ විතරක් දකින ගෑනු ඉන්නව නම් ඒ නවකතාවලම විතරම තමා ...'

මිතුරා එවර කීවේ සතුටෙනි.

මං යන්නම්

සුගත් යළි කීවේය.

මං හරියි කියලා පලයං

හරි මචං උඹ හරි

අවසානයේ දී සුගත් කීවේය.

සුවඳයිද කොයිතරම් මල් පිපෙන නිම්නයේ
පෙති පුරා මකරන්ද රොන් සැලෙයි ජීවිතේ
සෙනෙහසම තවරනා හසරැලිම පළඳනා
ඔබයි හිරු නිල් ගිරේ
ආදරේ උදෑසන මට ගෙනා

හද සුසුම් මඳ පවන් හිත පුරා එති එතී
නෙත් කැළුම් පිය වදන් ගිම්නිවයි නිම් නැතී
සීත රොන් සුනු සුවඳ-නෙතු පියන් පිරිමදින
ඔබයි සඳ ස්නේහයේ-සිත සඳුන් ගල්වනා

දරු පැටව් ආදරේ සමනොලෙහි සතපනා
පියවරෙන් පියවරේ සෝ තැවුල් වළකනා
සසර හුරු සේ පෙම්න-සෙවනැල්ල සේ හිඳින
ඔබයි මුළු ජීවිතේ-පැතුම් සපුරා ගෙනා

මිතුරා සතුටින් සිනාසෙද්දී සුගත් අවන්හලෙන් නික්මිණි.

තමන්ගේ මනුස්සයගෙ හොඳ දකින ඒ හොඳ අනෙක් අය ඉදිරියේ වර්ණනා කරන දරුවන්ට ආදරණීය මවක් වුණු ගෙදරට සිරිකතක් වුණු ගෑනියෙක් ගැන මං සිංදුවක් ලියන්න ඕනෑ.

සුගත් තමන්ටම කියා ගත්තේය.

ඔහු ඒ ගීතයෙන් ලිව්වේම ආදරණීය බිරිඳකගේ මුළු ලෝකයම වූ ආදරණීය සැමියකු පිළිබඳවය. අඳුරු රාත්‍රියේ දී ඔහු සිසිල් සඳද හිමිදිරියේ දී ඔහු රන් ඉර ද වන්නේය. පුංචි දුකක්වත් හිතට නොදෙන මේ ආදරණීය සැමියා සසරේ හැම බවයකම අගේ ළඟ හිඳී ඇගේම සංසාරික ප්‍රාර්ථනා විය. ගත වෙහෙසුණු විට පවන් රොදක් ද පිපාසාවට සීතල පැන් පොදක්ද වන්නේ ඔහුය.

සුගත් සෝමවීර මේ ගී පද ලියා නිම වූ විගස ඔහුට හිතුණේම ඒ පද වඩාත් ගැලපෙන්නේ විශාරද ශෂිකා නිසංසලාට බවය.

ශෂිකාත් මේ සිංදුවෙ වගේම ගුණවත් බිරිඳක් යහපත් මවක් එයා ඒ නිසා මේ සිංදුව ලස්සනට කියාවි.

සුගත්ගේ විශ්වාසය විය.

මේ ගීතය අහන ගෑනු ටිකටවත් තමන්ගේ මිනිහා දෙවියෙක් වගේ දැනෙයි නම් තමන්ගෙ පවුල දිව්‍යලෝකෙ වගේ දැනෙයි නම් මට ඒ ඇති.

සුගත් ගීතය මාලක රත්නායකට යැව්වේම එලෙස සිතමිනි.

නව පරපුරේ දක්ෂ සංගීතඥයෙක් වන මාලක රත්නායක ගීතයට මියුරු තනුවක්ද සංගීතයද නිර්මාණය කළේය.

## ශෂිකා නිසංසලාගේ හඬින් සුගත් සෝමවීරගේ ගී පද



සුගත්



මාලක



ශෂිකා

ශාන්ත කුමාර විතාන

සිතුවම: සමන් කළුබෝවිල

# "33 කාමරයෙන්" පෑයූ තරුව

**සිරස රූපවාහිනියේ විකාශය වන "33 කාමරය" අධ්‍යාපනික වාර්තාමය ටෙලිනාට්‍ය මාලාවේ වැඩිම කොටසක රඟපෑවේ ඇයයි. මේ නිසාම ඇයට බොහෝ දෙනාගේ ජනප්‍රියත්වය හිමිවූවාය. එහෙත් ඒ නිසාම සමහර අධ්‍යක්ෂවරු ඇය තමන්ගේ අලුත් නිර්මාණවලට සම්බන්ධ කර නොගත්තාය. හේතුව "33 කාමරය" ටෙලිනාට්‍ය මාලාවේ රඟපෑම හේතුවෙනි. ඒ පිළිබඳව කන්ද උඩරටින් කලා ක්ෂේත්‍රයට එක්වූ නිරාශා අබේසිංහ "සඳැල්ල"ට පැවසුවේ මේ අයුරිනි.**



නිරාශා

"මම කලා ක්ෂේත්‍රයට ඇවිත් දැන් අවුරුදු 16කටත් වැඩියි. පාසල් කාලයේ ඉඳලම රංගනයට තිබුණේ පුදුම කැමැත්තක්. තැන්නකුඹුර මහා විද්‍යාලයේ හා මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ ඉගෙන ගන්නා කාලයේදීම නර්තනයට දක්ෂ හින්ද, මම නර්තන කණ්ඩායමක සාමාජිකාවක් වුණා. කොහොම හරි පාසලෙන් පස්සේ සනත් අබේසේකරගේ "දිය මකුළුවෝ" ටෙලි නාට්‍යයෙන් පුංචි තිරයට එන්න පුළුවන් වුණා.

ඊට පස්සේ "අහසින් වැටුණා, සුජාතා, පියලඳ සුසානෝ, දූවිලි සුවඳ, රඟ සොබා, සිරි සිරිමල්, වැහිලිහිණි, අහස් මාළිගා" වැනි ටෙලිනාට්‍ය 40කට වඩා රඟපෑවා. "උමතු, 33 කාමරය, ඉව" වැනි ටෙලිනාට්‍ය මාලාවල ප්‍රධාන චරිත 50කට වඩා රඟපෑමේ වාසනාවත් මට හිමිවුණා. ඒත් සමහරු ඒ නාට්‍යවල රඟපෑව නිසා තෝරාගත්තේ නෑ. ඔවුන්ගේ අලුත් නිර්මාණවලට. මම කියන්නේ ඒවා වැඩිහිටියන්ට පමණක් සීමාවූ ටෙලිනාට්‍ය නොවෙයි. අනෙක අපි නිරුවතින් හෝ අඩ නිරුවතින් ඒවායේ රඟපෑවේ නෑ. ඒවා අධ්‍යාපනික නිර්මාණ. එතනදී අපි කළේ රඟපෑමක් විතරයි. වැරදි විදිහට බලන්න එපා කියලයි මම ඉල්ලන්නේ. අපේ හැකියාවට, දක්ෂතාවයට තැනක් සමහරු දුන්නේ නෑ.

මම "අලිපැටියෝ" ඔයයි මමයි, ගෝරි, කෝ මාර්ක් නෝ මාර්ක්, ෆේස් ටු ෆේස්, දෙංඩි, ගුත්තිල මුසිල, පාස්පෝර්ට්" වැනි චිත්‍රපට 20කට වඩා රඟපාලා තිබෙනවා. මාත් එක්ක එකට පැමිණි නදීෂා හේමමාලි, උදයන්ති කුලතුංග අද කලා ක්ෂේත්‍රයේ ඉදිරියට ගිහින්. මට ඒ වාසනාව ලැබුණේ නෑ. හැකියාව තිබිලත් අපට සමහරු උදව් කළේ නෑ. ඒත් සමහරු ඒ දක්ෂතාවයට තැනක් දුන්නා. මගේ ගමන හෙමින් යනවා. මම ඉල්ලන්නේ අපේ හැකියාවන් රටට පෙන්වන්න අවස්ථාවක් දෙන්න කියලයි. අදටත් මම නර්තන කණ්ඩායමේ ඉන්නේ, මුල අමතක නොකළ නිසයි. චරිතවලින් අපිව කොන්කරන්න එපා. හැකියාවට තැනක් දෙන්න. අධ්‍යක්ෂවරුන්ගෙන් මම ඉල්ලන්නේ එයයි."

**සමන්ත යහම්පත්**


# අහස් වියන

පුරවර දෙරටුව විවර කරනු මැන
ඔබේ සුපෙම්බර රාජධානියේ
පිටවී යන්නට ඉතිං අවසරයි
රාජධානියේ ප්‍රේම නගරයෙන්

මා ලය විනිවිද ගිය හී සැර විද
මසිත පැහැරගෙන මා සිර කරගෙන
මට දුන් දඬුවම් අවසන් කළ මැන
පිටවී යන්නට ඉතින් අවසරයි
ඔබේ සුපෙම්බර රාජධානියෙන්

ඔබ හද පිරිමැද ඔබටම පෙම් බැඳ
යන තැන ලුහුබැඳී ඔබටම බැඳී හිත
ඔබෙන් මුදහැර ආපසු දුන මැන
පිටවී යන්නට ඉතින් අවසරයි
ඔබේ සුපෙම්බර රාජධානියෙන්

ශකුවි



සිතුවම: සමන් කළුබෝවිල

# Travel

**නොවැම්බරය, යාලට වැහිබරය. උදේ හයටත් අරුණලු දකින්නට නැති තරමට අහසේ අඳුරු වලාකුලකි. එහෙත් ගස් වැල්වල වූයේ අපූරු ප්‍රාණවත් බවකි. හැම ගහක්ම දීප්තිමත් කොළ පැහැයකින් සැරසී තිබිණි.**

අපි යාලට ඇතුලු වන විටම, වම් පැත්තේ ටිකක් දුරින් සිටියේ මොනරෙකි. පිල් කළඹත් ඇදගෙන බිම දිගේ ඇවිද ගිය ඌ දවසේ මෙහෙවර පටන්ගෙනය.

මොනරාගේ දවසේ මෙහෙවර යනු ආහාර සෙවීමයි. ලොව වෙසෙන සෑම සතෙකුම දවසේ වැඩි කාලය යොදන්නේ බඩ පුරවා ගැනීමටය. තණ බිම්වල ගැවසෙන කුඩා කෘමීන්, ධාන්‍ය වර්ග මොනරාගේ සුපුරුදු ආහාරයයි.

යාල යනු 'කොටි' පාරාදීසයකි. යාල අද්දර ඇති සුවිසල් පුවරුවේ සටහන් වන්නේද එසේය. එහෙත් මට නම් හිතෙන්නේ යාල, මොනර පාරාදීසයක් බවය. යාලේ වැඩිපුරම දකින්නට ලැබෙන්නේ මොනරුන්ම වන බැවිනි.

මොනරා ලංකාවේ සිටින ලස්සනම කුරුල්ලාය කිවහොත් එය අතිශයෝක්තියක් නොවේ. හිස මත ඇති කුඩුම්බිය කිරුළක් වැන්න. සිහින් ගෙල දීප්තිමත් නීල පැහැති පිහාටුවලින් වැසී තිබේ. මොනරාගේ විචිත්‍රතම ආභරණය පිල් කළඹයි. විසිතුරු කැටයම් සහිත උගේ දිගු පිහාටු විහිදුවා ගෙන ඌ නටන නැටුම. එවිට හැම පිහාටුවකම අග්ගිස්සෙ ඇති 'ඇස' දිලිහෙන අරුමය.

ගුරු පාට පාරට මඳක් ඔබ්බෙන් සිටියේ පිල් විදහා ගත් මොනරෙකි. එහාටත් මෙහාටත් හැරෙමින් ඌ ඉදිරිපත් කරන්නේ විසිතුරු නැටුමකි. පිල් කළඹ වටාපතක් මෙන් විහිදගෙන සිටියත් ඒ පිහාටුද කිසියම් රිද්මයකට චලනය වනු පෙනේ.

මේ කාලය තුළ කවුරුන් හෝ 'ඩාන්සින් ස්ටාර්' තරගයක් තිබ්බොත් එහි අනිවාර්ය ජයග්‍රහණය හිමිකරගන්නේ මේ මොනරාම බවට කිසිදු සැකයක් නොමැත.

මඳක් ඈතින් සෙබඩකි. හැබැයි ඇය ඇගේ පාඩුවේ කන්නට දෙයක් සෙව්වා මිස මේ මොනර නැටුම දෙස ඇහැක් ඇර බැලුවේ නැත.

තම සැමියා ගැන කිසිදු ඇගැයීමක් නැතැයි බොහෝ පිරිමි ගැහැනුන්ට චෝදනා කරන්නේ බොරුවට නොවිය යුතුය. නැත්නම් මේ සෙබඩ, මේ මොනර නැටුම දෙස බලාසිටිය යුත්තේ ඇස් කන් ඔක්කෝමත් ඇරගෙනය. හැබැයි බැරිවේලාවත් මේ නැටුම නැටුවේ සෙබඩනම්, මොනරා ඇය දෙස බලාසිටිනු ඇත්තේ බොහෝ ආශාවෙනි.

ඒ අතින් බලනවිට මොනරා මොනතරම් අවාසනාවන්තයෙක් දැයි මට සිතේ.

දැන් මිනිත්තු දහයක් අවසානය.

මොනරා තවමත් නටයි. විහිදූ පිල තාමත් විහිද වූ ගමන්ය. කී වතාවක් නම් පැත්තෙන් පැත්තට හැරුණාදැයි ගණන් කරන්නට බැරිවිය. ඌ තවත් වේලා නටනු ඇත.

කතාවට කියන්නේ මොනරා නටන්නේ හිරු පිළිගන්නට බවය. එහෙත් ඇත්තම කතාව නම් ඌ මේ තරම් දඟලන්නේ සෙබඩුන්ගේ ඇල්ම බැල්ම ලබාගන්නටය. ගැහැනු සතුන්ගේ ආකර්ශනය දිනාගන්නට හැම පිරිමියෙක්ම කරන්නේ ලොකු කැපකිරීමකි. මොනරා ඒ වෙනුවෙන් කරන්නේ ලස්සනට නැටීමය. මේ නැටුමට වසඟවෙන එකම එක සෙබඩක්වත් සිටිය හැකිය.

අපි ඉදිරියට ගියෙමු. විලපලා වැව පසුවනවාත් එක්කම කටුපිල ගස්ගොම්මනක් විය. ඒ ගස් ගොම්මනේ සුදු පාට බෝල බෝලය. වඩාත් විමසිල්ලෙන් බැලුවොත් ඒ කටුපිල ගෙඩි බව හඳුනාගත හැකිය. මොනරෙක්, දැඩි කලබලයකින් කටුපිල ගෙඩි ගිල දමන හැටි නෙතට අසුවිය.

වස්සානය වනන්තරයට වසන්තය ගෙනෙන කාල පරිච්ඡේදයකි. හැම ගහක්ම කොළ පාට වී ඇති බව කලින් ද කීවෙමි. ඊට අමතරව බොහෝ ගස්වල ගෙඩිද පිරී තිබේ. කටුපිල, දිවුල් ගෙඩිවලින් බහුලය. රණවරා ගස්වල මල් පිපී තිබේ. පුංචි වැල්වලද පුංචි පුංචි මල් පිපී තිබෙන හැටි බලන්නට අපූරුය.

එක් ගසකට නැගුණු මොනරෙක් අප දෙස බලා උන්නේ ආඩම්බරයෙනි. කුරුලු ලොවේ රජ්ජුරුවෝ තමන් බව ආඩම්බරයෙන් කියාපාන්නක් මෙන් වනපෙත නිරීක්ෂණය කරමින් සිටියේය. උගේ පිල් කලඹ එවිට තිබුණේ ගහෙන් පහළ අත්තක ගැටෙමිනි. මෙය ඌට නිදහස් ඉරියව්වක් විය හැකිය. බිම ඇවිද ගියානම් පිල් කළඹ ඔසොවා ගෙන යායුතුය. නැතිනම් පිහාටු බිම දිගේ ගැටෙයි.

මට හිතෙන්නේම මේ පිල් කලඹ, මොනරාට බරක් කියාය. අඩි පහක් පමණ දිග පිහාටු තිහක් හතළිහක් පිල් කළඹේ ඇත.

මොනරා සිටියේ කිසියම් විමතියකිනි. වනයේ කුමක් හෝ දෙයක් සිදුවන්නාක් වැන්න. මොනරා සිටි ගස අසලම බිම සිටි මුව නාම්බන් හතර දෙනෙක්ද හිස ඔසොවා වනපෙත දෙස බලා සිටිති.

දිවියෙක්වත්ද?


දිවියාගේ පුල්ලි පුල්ලි හම මොනරාට ආකර්ෂණයකි. ඒ විචිත්‍ර සිත්තම දකින හැම විටෙකම ඌ එදෙස බලාසිටින්නේ ආසාවෙනි. එහෙත් ඒ ආශාවම මොනරාට විනාශය කැඳවයි. අවුරුදු තිස් පහක් පමණ ජීවත්විය හැකි මොනරා දිවි හමට දක්වන අසාමාන්‍ය ප්‍රේමය හේතුවෙන්ම අඩු වයසින් දිවියාට ගොදුරක් වන අවස්ථා බොහෝය.


















# යාල කැළේ මොනර රැඟුම්

ශාන්ත කුමාර විතාන
ඡායාරූප: දිනේශ් පෙරේරා

වරක් මම ඉන්දියානු දඩයක්කරුවන් මොනරා දඩයම් කරන හැටි සටහන් වූ ලිපියක් කියැවීමි. ඊට අනුව දඩයක්කාරයා මොනරාට කිට්ටු වන්නේ දිවි හමකින් සිරුර ආවරණය කරගෙනය. දිවි හමේ විචිත්‍රත්වයට වසඟ වන මොනරා එදෙස බලා සිටියදී දඩයක්කාරයා මොනරාට ගිනි බිදියි. නැත්නම් හෙල්ලයෙන් ඇණ මරාගනියි.

මේ අනුව මොනරාගේ සතුරන් දිවියා, වල්බළලා සහ මිනිසා ය. එහෙත් වනාන්තරයේ වෙසෙන නපුරා වන රාජාලියා ද මොනරාගේ සතුරකු බව කියති.

වරක් තණබිමකට වැදී රැඟුමේ යෙදී සිටි මොනරකු එක්වරම පිළ අකුලාගෙන තණබිමෙන් පලායන හැටි සත්වලෝලියකු දැක තිබිණි. ඒ සමගම තණ බිමට පහත් වූයේ රාජාලියෙකි. මොනරා පලාගියේ මේ රාජාලියාගේ බැල්ම තමන් වෙත යොමු වූ ඇසිල්ලේමය.

මම මතක අවදි කරමින්ම මොනරා දෙසත් මුව රැළ දෙසත් බලා හිඳිමි.

කාලය තත්පරවලින් මිනිත්තුවලට පරිවර්තනය විය. වනපෙත සංසුන්ය. කිසිදු හඬක් නොනැගුණෙන් මුවෝ හිස් පහත් කර වැස්සට මතුවුණු ලා තණ පත්වල රස බලන්නට වූහ.

මොනරා අර අවලස්සන නාදය නැගීය.

අපි බුතව වැව පසු කළෙමු.

ගස්වලින් තොර විවෘත භූමි භාගයකි. තවත් මොනරෙක් පිල් විදහා ගෙන සොඳුරු නර්තනයක යෙදෙයි. කොයි තරම් දැක්කත් එපා නොවන මේ සොඳුරු රැඟුම වෙනුවෙන් ද අපි මිනිත්තු කිහිපයක්ම වැය කළෙමු.

එහෙත් අර සෙබඩුන් මේ මොනර මනමාලයාගේ රැඟුම් ගැන උනන්දු නොවන්නේ ඇයි දැයි මම යළිත් සිතීමි.

හේතුව උගේ මනමාලකමට උන් අකමැති වීමවත්ද?

මොනරා යනු පොදු පුරුෂයෙකි. මොනර කිරිල්ලියන් හය හත් දෙනෙක්ට පෙම් කරමින් උන් සියලු දෙනා තම භාර්යා තනතුරේ තබාගන්නට හැම මොනරෙක්ම කැමැත්තක් දක්වති. රජකමත් සමඟ අන්තඃපුරයක් හිමිවීම සාමාන්‍ය කාරණයකි. මොනරා කැලෑවේ රජු නම්, ඌට අන්තඃපුරයක් තිබීම වරදක්ද?

එහෙත් මොනර කිරිල්ලියන් එසේ නොසිතනවා ඇතැයි මගේ සිත කියයි. මොනර රැඟුම් ගැන උනන්දුවක් නොදක්වන කාරණාව එයම විය යුතුය.

යාල වැවද පසුකර ගිය අපි මැණික් ගඟ දෙසට හැරුණෙමු. එක් මොනරෙක් කලබලකාරයෙක් වී සිටිනු දැකගත හැකි විය. බොහෝ කලබලයෙන් යම් කිසිවකු සමඟ සටන් කරනවාක් වැනිය. එහාටත් මෙහාටත් පනිමින් ඌ සටන් කරන්නේ කා සමඟද?

සර්පයෙක්...

අපේ සෆාරි ජීප් රියේ රියැදුරා වාහනය නවතමින් පැවසුවේය.

"මොනරාට සර්පයෝ පේන්න බැහැ. සර්පයෙක් දැක්කොත් කොටලම මරනවා."

මම වුවමනාවෙන්ම මොනර සර්ප සටන දෙස බලා සිටියෙමි. විටෙක උඩ පැන හොටින් කොටන ඌ ඒ ඇසිල්ලෙන්ම ඉවතට පනින්නේ සර්පයා විෂඝෝර බව දන්නා නිසා විය යුතුය.

සටන ටික වේලාවක් පැවතිණි. අන්තිමේදී ඒ මොනරා තණබිම දිගේ දිවයන්නට විය. සර්පයා මොනරාට දෂ්ට කළාද නැත්නම් ඌ මැරුණාද පලාගියාද යන්න හරියටම දැනගන්නට ක්‍රමයක් නොවූයේ සටන් පැවැතියේ අපේ නෙත් මානයට සැහෙන දුරකින් බැවිනි.

අපි යාල බංගලාව අසලින් වූ පාර දිගේ යාල වැවේ පිටුපසින්ම ගමන් කරන්නට වීමු. උසැති ගසක අත්තක් මත වාඩි වූ තවත් මොනරෙකු අපේ නෙතට අසුවිය.

සාමාන්‍යයෙන් මොනරා රාත්‍රිය ගතකරන්නේ වැවකට යොමුවුණු අත්තක් මතය. තම බිරින්දෑවරුන්ද පිරිවරාගෙන අත්තක ලැග රැය පහන් කරන්නේ තමනට පූර්ණ ආරක්ෂාව සලසා ගනිමිනි. වැවට යොමු වූ අත්තකට, සතුරකුට පහසුවෙන් ළඟාවන්නට පුළුවන්කමක් නැත. එසේම අඹු සිඟිත්තන් හය හත් දෙනකුගේ ආරක්ෂාව ද මේ මොනරාට මොනවට ලැබේ.

අපි තවත් බොහෝ වේලාවක් යාල කැලේ කරක් ගැසීමු. ආකාස චෛත්‍යය පාර පැත්තේ දැඩි වනගහනයක් ගල් කුලු රැසක් තිබූ නිසාදෝ ඒ ඉසව්වේ මොනරු ගැවසුණේ නැත. ඉන් මා තේරුම් ගත්තේ මොනරු කැමති ජලය අහල පහල තිබෙන තණ බිම් ඇසුරට බවය.

අවසානයේදී අපි යාල වන උයනෙන් නික්මුනෙමු.

"හූ... යනවද  යනවද යනවද?"

මොනරෙක් මහ හඬින් අපෙන් අසන හැටි මට ඇසිණි.

# මීළඟට තියෙන්නෙ ගී ගයන අදහසක්






**සමාජයේ සමහර තරුණයන්ට ජීවිතයේ තමුන් මොනවද කරන්නෙ කියලා කිසි අවබෝධයක් නැහැ. ඒ නිසා නිශ්චිත ගමන් මාර්ගයක් තෝරා ගන්න බැරි වෙනවා. ඒත් මේ තරුණයා නිශ්චිතවම අරමුණු කර ගත්තෙ රංගනයෙන් ගමනක් යාමටයි. ඒක ආසාවකට එහා ගිය උනන්දුවක් කිව්වොත් හරි. ඒ නිසාම පාසල් සමයේ දී දක්ෂ වූ ක්‍රිකට්, වොලිබෝල් පැත්තකට දාලා රංගනය තෝරා ගත්තෙ ඔහු මේ දිනවල අපට හමුවන්නෙ හිරු ටී.වී. එකේ විකාශය කෙරෙන "රැල්ල වෙරළට ආදරෙයි" සහ තවත් නාට්‍ය කිපයක් සමගයි. කවුද මේ තරුණ රංග ශිල්පියා කියා අපි බලමු.**

**• නම කියමු නේද?**
චතුර එරංග රාජපක්ෂ.

**• කියන්නකො චතුර ගැන?**
මම දැනට රංගන ශිල්පියෙක්. එය වෘත්තියක් කර ගැනීම තමයි ආසාව. සම්මානලාභී - වෘත්තීය රංගන ශිල්පියකු වීම අරමුණයි.

**• ඇයි රංගනය තෝරා ගත්තෙ?**
ඒක කුඩා කාලයේ ඉඳලම තිබූ ආසාවක්. ඒක ඇතිවුණේ මගේ අයියා රඟපෑ නාට්‍යයක් දැකපු නිසයි. එදා මට ලොකු තේරුමක් නැතත්, මටත් රඟපාන්න ආස හිතුණා. අයියා එදා දහම් පාසලේ කළ නාට්‍ය රංගනය දැකලා ඒ විදියට මටත් කරන්න ඇත්නම් කියලා හිතුවා.

**• චතුර කියන්න ද? එරංග කියන්න ද?**
මම භාවිත කරන්නෙ චතුර රාජපක්ෂ කියලයි.

**• චතුරගෙ ගම?**
මරදන.

**• කියමු පාසල ගැනත්?**
පාසල් තුනකට ගියා. මාලිගාවත්ත ශ්‍රීමත් බාරොන් විද්‍යාලයට, බණ්ඩාරවෙල ධර්මාශෝක විද්‍යාලය සහ උසස් පෙළ කළේ කොළඹ රාජසිංහ මහා විද්‍යාලයේ.

**• ඉගෙනීමට දක්ෂ වුණා ද?**
උසස් පෙළ වාණිජ අංශයෙන් පෙනී සිටියේ.

අරමුණ වුණේ නළුකමම තමයි.

**• පවුලේ විස්තර කියමු?**
මමයි, අම්මයි - තාත්තයි, අයියයි. තාත්තා දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවය කළේ. අම්මා ගෘහණියක්. අයියා පුද්ගලික ආයතනයක සේවය කරනවා.

**• "චතුර" පටන් ගන්නෙ කොතැනින් ද?**
මුලින්ම "අභින" පාඨමාලාවට සම්බන්ධ වුණා. ප්‍රවීණ රංගවේදිනී අනෝජා වීරසිංහ මහත්මිය යටතේ "අභින" නිසා බොහෝ දේ හදාරන්න පුළුවන් වුණා. පසුව මේ රංගන විෂය පුළුල්ව හදාරන්න මහේන්ද්‍ර පෙරේරා ප්‍රවීණයා ළඟට ගියා. ප්‍රවීණ රංගවේදී ජගත් චමිල අයියා නිසා තමයි අනෝජා වීරසිංහ මහත්මිය හමුවට යන්න මට අවකාශය ලැබුණෙ.

**• මුලින්ම රඟපෑවේ ?**
සුසිල ආයතනය කළ "සෙල්ෆි" නාට්‍යයේ. TV-1 එකේ එය විකාශය වුණා.

**• "චතුර" ගැන වැඩි දෙනෙක් දැන ගත්තෙ?**
"රාවණ" නාට්‍යයේ කළ චරිතය සහ හිරු ටී.වී. එකේ විකාශය කෙරෙන නිවන්ත ප්‍රසාරණගේ "රැල්ල වෙරළට ආදරෙයි" නාට්‍ය නිසයි.. ඊටත් අමතරව ඉන්දික ධර්මතිලකගෙ "අඳුන්ගිර" යනවා. තව ප්‍රවීණ අධ්‍යක්ෂ ක්‍රිෂ්ටි ෂෙල්ටන් ප්‍රනාන්දුගෙ "සකුණ පියාපත්" විකාශය වෙනවා. ඊටත් අමතරව රනිල් කුලසිංහගෙ පානාමංකඩ ස්වර්ණවාහිණියේ විකාශය වෙනවා.

**• එයින් වැඩිපුර කතා කරන්නෙ?**
"රැල්ල වෙරළට ආදරෙයි" නාට්‍යයේ - "ජූඩ්" ගෙ චරිතය නිසා.

# මමත් මුහුදට ආදරෙයි



**• ඒ කියන්නෙ චතුර කාර්ය බහුලයි?**
මේ දවස් ටිකේ ටිකක් කාර්ය බහුලයි.

**• "චතුර" කොහොම කෙනෙක් ද?**
අහිංසකයි කියලා හිතනවා. සරල - විනෝදයට කැමති කෙනෙක්.

**• රංගනයට ආ එක හොඳද?**
ඇත්තටම මගෙ ආසාව රංගනය නිසා මම කැමැතියි. ඒ නිසා උපරිම කැපවීම කරනවා.

**• තවම චතුර තනිකඩ ද?**
ඔව්... ඔව්.

**• ආදරයක් නැහැ?**
ආදරය ලබනවා. මගේම කියලා ආදරයක් ඉදිරියේ දී බලාපොරොත්තු වෙනවා.

**• චතුර දක්ෂ රඟපෑමට විතරම ද?**
එහෙම හිතනවා. පාසල් කාලයේ දී ක්‍රීඩා බොහොමයක් කළා. පාසල් පළමු පෙළ ක්‍රිකට් කණ්ඩායම නියෝජනය කළා. අත්පන්දු ක්‍රීඩා කළා. සිංදු කියනවා. දැනටත් වෙලාවක් ලැබුණොම ක්‍රිකට් ගහනවා. ක්‍රිකට්වලට එච්චරටම ආදරෙයි.

**• කවුද ප්‍රියතම ක්‍රිකට් ක්‍රීඩකයා?**
සංගක්කාර.

**• රඟපෑම කියන දේ හැමෝටම කරන්න පුළුවන්ද? බැරිද?**
මම හිතන විදියට බැහැ. රංගනයට විතරක් නෙවෙයි, ඕනෑම අංශයකට හැදෑරීමක් නැතුව ගමනක් යන්න බැහැ. උපරිමයෙන් කැපවෙන්නත් බැහැ. හැදෑරීමක් නැතුව සියයට සියයක් කැපවීම දෙන්න බැහැ.

**• "චතුර" හෙවත් "ජූඩ්" ට ප්‍රේමයක් තිබිලාම නැද්ද?**
ආදරයක් ලැබිලා තියෙනවා. නැත්තෙම නැහැ.

**• ආදරය මොන වගේ ද?**
ආදරය කියන දේ අපි තේරුම් ගැනීමයි. අල්ලා ගැනීමට වඩා තේරුම් ගැනීම සහ නිදහසයි. සැබෑ ලෙස ආදරේ නම් අල්ලා ගත්තම ඕනෑ නැහැ. අයිත්කර ගැනීමම නෙවෙයි සැබෑ ආදරය.

**• "චතුර" රැල්ලට බය ද? කැමති ද?**
මුහුදට මම ආදරෙයි.

**• "චතුර" ගැන "චතුර" ට කොහොමද හිතෙන්නෙ?**
තවම මම අත්දැකීම් ලබන ජීවිතය සොයා යන ශිෂ්‍යයෙක් වගේ කියලයි මට හිතෙන්නෙ. ජීවිතය සොයා යන්න පටන් ගත්ත කෙනෙක්. තවම පියවර තැබුවා විතරයි. ජීවිතය තවම හොයමින් ඉන්නෙ.

**• "ජීවිතය" මොකක් කියල ද හිතෙන්නෙ?**
මට හිතෙන්නෙ ඉතින් ජීවිතය කියන්නෙ සෑම දෙයක් ගැනම තේරුම් අරගෙන ජීවත් වීම වෙන්න ඇති. තවම මම ජීවිතය ගැන හොයන කෙනෙක්. නිසා හරි හැටි අරුතක් කියන්න බැහැ.

**• අපි නොදන්නා තවත් දක්ෂතා තියෙනව ද?**
ගීතයක් ගැයීමේ අදහසක් තියෙනවා.

**• මේ හමුවෙදි අපට තවත් මොනවද කියන්න තියෙන්නෙ?**
රංගනය උදෙසා මගේ උපරිමය කරන්න කැපවෙනවා. මැරෙනවා කියල දේ වචනා ගෙන සමාජයට හොඳ දේ කරන්න උත්සාහ ගන්න කියන පණිවුඩය තාරුණ්‍යයට දෙන්න කැමැතියි.



# චතුර එරංග රාජපක්ෂ

සඳුන් ගමගේ

# කටකාර දෙබස්වලට මම ආසයි

මේ දිනවල පුංචි තිරයේ සා අතරත් ජනප්‍රිය පුංචි රංගන තරුවක් අද අපේ කතාබහ තුලින් මුණ ගැහෙන්න සිටුවා. මීනායා සහ තාරා යන චරිතවලින් ඇය හමුවන්නේ මේ දිනවල විකාශය වන "කියා දෙන්න ආදරේ තරම්" සහ "අඳුන්ගිර" ටෙලි නිර්මාණ ඔස්සේයි. පුංචි තිරයේ හැඩ වැඩ දාන මේ පොඩි රුවැත්තිය පහන්දි නෙතාරා නුරතල් බස් ගොන්නක් සමඟ සඳැල්ල කතාබහට එකතු වූයේ මෙලෙසින්.











**• ඉතින් කොහොමද?**

ගෙදරටම වෙලා ඉඳලා එපා වෙලා හිටියේ... දැන් ඉස්කෝලෙ පටන් ගත්තානේ... ඉස්කෝලේ යනවා. ඒවත් එක්ක රූ ගතකිරීම් වැඩ කටයුතුත් කරනවා.

**• කියමුකෝ බලන්න පහන්දි දුවගේ විස්තර ටිකක්?**

මගේ නම පහන්දි නෙතාරා. පවුලේ ඉන්නේ අම්මයි, තාත්තයි, අයියයි, මමයි. තාත්තා රසික චතුරංග. තාත්තා ව්‍යාපාරිකයෙක්. අම්මා තමාලි රනෝජා, අම්මා ගෘහණියක්. අයියා විහඟ මනෝද්‍ය, මගේ වයස අවුරුදු අටයි. මම රත්නපුර ජේ.එම්.සී. ජාත්‍යන්තර පාසලේ 3 වසරේ ඉගෙන ගන්නවා.

**• පහන්දි දුවට කොහොමද මුලින්ම රඟපාන්න අවස්ථාව ලැබෙන්නේ?**

මගේ පවුලේ කිසිම කෙනෙක් කලාවට සම්බන්ධ නැහැ. මම පුංචි කාලේ වෙඩින් එකක මල් කුමාරිට ගියා. එතකොට අසංක කියලා මාමා කෙනෙක් මාව දැකලා වෙළඳ දැන්වීමට දෙන්න පුළුවන් ද කියලා අම්මාගෙන් මාව ඉල්ලලා තියෙනවා. ඒ විදිහට මම මුලින්ම කැමරාවක් ඉස්සරහට ආවේ අවුරුදු තුනේදී. වෙළඳ දැන්වීම් ගොඩාක් කළා. ඒ අතරේ තමයි මම ටෙලිනාට්‍යවලට සම්බන්ධ වෙන්න අවස්ථාව ලැබුණේ.

මුලින්ම දෙරණ නාලිකාවේ විකාශය වුණු රාවණා ටෙලි නාට්‍යයේ මන්දෝදරි කුමාරියගේ පුංචි කාලේ චරිතය මට කරන්න අවස්ථාව ලැබුණා. එතැනින් පස්සේ, අමාලියා, සංසටන, සේලි, දම් ටෙලි නාට්‍ය කීපයකට දායක වුණා. මේ දවස්වල කියාදෙන්න ආදරේ තරම්, සකර්ම, අඳුන්ගිර ටෙලි නාට්‍ය තුනේම මම රංගනයෙන් දායක වෙනවා.

**• පුංචි කාලේ ඉඳලා පහන්දි රඟපාන්න ආසයි ද?**

රඟපාන්න එනකල් මට රඟපාන්න පුළුවන් කියලා දැනන් හිටියේ නැහැ. ක්ෂේත්‍රයේ ප්‍රවීණ නැන්දලා මාමලා මට ගොඩක් දේවල් කියලා දෙනවා. ගොඩක් ටෙලිනාට්‍යවලට ලැබුණු චරිත එකිනෙකට වෙනස්. වැඩ කරන පිරිස වෙනස්. ඒ හැම තැනකින්ම මට අලුත් දේවල් ඉගෙන ගන්න ලැබෙනවා.

**• කියාදෙන්න ආදරේ තරම් ටෙලිනාට්‍යයේ "මීනායා" වෙන්න කොහොම ද දුවට අවස්ථාව ලැබෙන්නේ.**

ඒකේ අධ්‍යක්ෂ ධනුෂ්ක රත්නායක මාමාගේ කලින් දම් ටෙලි නාට්‍යයේ මම බට්ටිච්චාගේ චරිතය කළානේ. ධනුෂ්ක මාමාම තමයි මට මීනායාගේ චරිතය දුන්නෙත්. බට්ටිච්චාගේ චරිතය වඩා මීනායාගේ චරිතය දැන් ගොඩක් ජනප්‍රියයි.

**• පහන්දිට කොහොම ද මීනායා දැනුනේ?**

මීනායාගේ චරිතය කරනකොට සමහර දෙබස්වල දී මට ඇත්තට ඇඬෙන අවස්ථා තියෙනවා. මීනායාගේ අම්මයි, තාත්තයි දෙන්නම ළඟ නැහැ. මීනායා ආච්චියි, සීයයි, ලොකු, දෙවෙනි ළඟ හැදෙන ළමයෙක්. කටකාර දෙබස්වලට මම ආසයි.

අමාරුම වැඩේ දෙබස් මතක තියාගන්න එක තමයි. මට කියන්න තියෙන්නේ දිග වාක්‍ය. සමහර වචන මට කියවෙන්නෙත් නැහැ. වැරදෙනවා. ඒත් ඒත් ධනුෂ්ක මාමා වගේම අනෙක් මාමලා නැන්දලා මට බනින්නේ නැහැ. අපි මෙහෙම කියමු කියලා හරිම ආදරෙන් මට කියලා දෙනවා.

**• මීනායා වගේම පහන්දිත් කටකාර කෙල්ලෙක් ද?**

ගෙදරදී නම් කෑ ගහලා අම්මාගෙන් ඕන තරම් බැනුම් අහලා තියෙනවා.

**• පහන්දි රඟපාපු චරිතවලින් ආසාවෙන්ම රඟපාපු චරිතත් තියෙනව ද?**

මට ලැබුණු හැම චරිතයක්ම ගොඩක් ජනප්‍රිය වුණා. ඒ නිසා විශේෂ චරිතයක් නැහැ. ඔක්කොටම මම ආසයි.

**• කොහොමද මීනායාගේ චරිතයට ලැබෙන ප්‍රතිචාර**

අම්මෝ ගොඩක් ප්‍රතිචාර ලැබෙනවා. ගොඩක් අය මට දැන් කතා කරන්නේ මීනායා කියලා. මම අධ්‍යාපනය හදාරන පාසලෙනුත් රඟපෑම් කටයුතු කරන්න ලොකු සහයෝගයක් දෙනවා. මගේ පාසලෙනුත් මගේ රංගන දක්ෂතාවලට ලොකු ප්‍රතිචාරයක් ලැබෙනවා. ඒ ප්‍රතිචාර එක්ක මට තවත් රඟපාන්න ආස හිතෙනවා.

**• ඒ කියන්නේ දිගටම රඟපාන්න ද බලාපොරොත්තුව ?**

ටෙලිනාට්‍යවලට ආරාධනා නම් ගොඩක් එනවා. ඒත් ඒ ලැබෙන නිර්මාණවල රඟපානවද? නැද්ද? කියලා තීරණය කරන්නේ අම්මා. හොඳම නිර්මාණයක් ලැබුණොත් විතරයි අම්මා මාව එක්කගෙන යන්නේ. අම්මා නිතරම කියන්නේ පූටින් අංක දෙක ඉගෙනීම අංක එක කියලා.

**• පහන්දි දුවට චිත්‍රපටිවලින් ආරාධනා ලැබෙන්නේ නැද්ද?**

ආරාධනා ලැබෙනවා. ගොඩක් දෙනෙක් මාව අඳුර ගත්තේ "ගෝරි" චිත්‍රපටය එක්ක. අදටත් මඟතොටේ දී හම්බවුණාම "පොඩි බේබි" කියලා තමයි කතා කරන්නේ. ඒ වෙනුවෙන් හර්ෂ උඩකන්ද මාමාට ගොඩක් ස්තූති කරනවා. පළවෙනි චිත්‍රපටයේ රඟපෑම දකිද්දී සතුට වැඩිකමට ඇඬුනා. මට වඩා ඒ සතුටට ඇඬුවේ මගේ අම්මයි, තාත්තයි.

**• රූපගත කිරීම් එක්ක පාසලේ වැඩ අතපසු වෙන්නේ නැද්ද?**

ගොඩක් පාසල් වැඩ අතපසුවීම් වෙනවා. ඒත් ගුරුවරු, පාසලේ යාළුවෝ මට අතපසු වෙන පාඩම් වැඩ මට කරගන්න ලොකු සහයෝගයක් දෙනවා.

**• මොනවද පහන්දි දුවගේ ඉදිරි අලුත් නිර්මාණ?**

ඉදිරියේ දී මානික්කාවත කියලා ටෙලිනාට්‍යකට ජගත් චමිල මාමා එක්ක මම අන්ධ චරිතයක් රංගනයෙන් දායක වෙනවා. අලුතින් නම් ටෙලිනාට්‍ය බාර ගත්තේ නැහැ කියලා අම්මා කිව්වා. අධ්‍යාපන වැඩ කටයුතු අතපසු වෙනවා කියලා. අධ්‍යාපන වැඩ එක්ක ඉඩක් ලැබුණොත් නිර්මාණ කටයුතු කරනවා.

**• පහන්දි දුවගේ මොනවද බලාපොරොත්තු?**

දැනට තියෙන එකම බලාපොරොත්තුව හොඳට ඉගෙන ගන්න එක. ලොකු වෙලා ඉංග්‍රීසි ටීචර් කෙනෙක් වෙන්න තමයි ආස.

**• දුවගේ කලා ගමනට උදව් කරපු අයත් මතක් කරමු ද?**

ධනුෂ්ක රත්නායක මාමා ආදරයෙන් මතක් කරනවා. ධනුෂ්ක මාමා තමයි මට රංගනයේ මේ තැන හදලා දුන්නේ. ඒ වගේම මගේ රංගන හැකියාවන්ට අවස්ථාවක් දුන්න සියලුම අධ්‍යක්ෂකරුවන්ට, මට උදව් කරන සියලුම නැන්දලා මාමලා ගෞරවයෙන් මතක් කරනවා. ඒ වගේම මීනායාගේ පණ වගේ ඉන්න ලොකු, දෙවෙනි දෙන්නවත් ආදරයෙන් මතක් කරනවා. අසංක විජේසූරිය මාමාවත් ආදරයෙන් සිහිපත් කරනවා. අසංක මාමා කතා කරපු වෙළඳ දැන්වීම නිසා තමයි අද මම මෙතන ඉන්නේ.



පහන්දි නෙතාරා

නදීශා අතුකෝරළ

කලා ක්ෂේත්‍රයේ විවිධ ඉසව්වලින් පියවරෙන් පියවර ඉදිරියට යන නව පරපුරේ දක්ෂයෙක් සමඟින් මෙවර සඳැල්ල කතාබහක නිරත වෙන්න හිතුවා. ඔහු චරිත් මධුරංග.

# මේ දවස්වල 'නඳුන්'ට බැනුම්

**• නාඳුනා මේ දවස්වල හොඳට බැනුම් අහනවා නේද?**

ඔව්, ඔව්. නඳුන් නම් මේ දවස්වල ටිකක් බැනුම් අහනවා.

**• ඉතින් මේ නඳුන් ගැන මුලින්ම කතා කරමු.**

නඳුන් ඉන්නෙ මේ දිනවල සිරස නාළිකාවේ විකාශය වන 'කියාදෙන්න ආදරේ තරම්' ටෙලි නිර්මාණයෙනේ. ඉතින් නඳුන් චරිතය මට ලැබෙන්නේ මෙහි අධ්‍යක්ෂවරයා ධනුෂ්ක රත්නායක අයියා හරහා. මට මේ ලැබිල තියෙන්නේ දුෂ්ට නසරාණි චරිතයක්. ටිකක් ජල්තර වැඩ තමයි කරන්නේ. නඳුන් චණ්ඩියෙක්ගේ ගෝලයෙක්. ඉතින් ඒ චණ්ඩියට ගෝලයෝ දෙන්නෙක් ඉන්නවා. ඒ දෙන්නගෙන්



චරිත් මධුරංග

අනිත් ගෝලයා කපාගෙන ඉදිරියට යන්න හදන චරිතයක් තමයි නඳුන්. ඉතින් ඒ කරන වැඩවලට මේ ටිකේ බැනුම් අහගෙන ඉන්නවා.

**• ඇත්ත ජීවිතේ කාවවත් කපාගෙන ඉදිරියට යන්න බලන්නේ නැහැනේ නේද?**

අනේ නෑ. එහෙම නම් අදහසක්වත් නැහැ.

**• එහෙනම් කියමු ඔබ ඇත්ත ජීවිතේ කොයි වගේද?**

ඇත්ත ජීවිතේ මම ගොඩක් මිත්‍රශීලී කෙනෙක්. දුෂ්ට, නපුරු කෙනෙක් නම් නෙමෙයි. හරිම අහිංසකයි.


**• ඉතින් මේ අහිංසක චරිත් මධුරංගට බනින අයට මොකද කියන්න තියෙන්නේ?**


ඇත්තටම මේ නාට්‍ය මේ වෙද්දි ගොඩක් දෙනෙක් බලනවා. හොඳ ප්‍රතිචාර නාට්‍යයට තියෙනවා. නාට්‍යයේ හැම චරිතයක්ම වගේ කතාබහට ලක්වෙලා තියෙනවා. ඉතින් YouTube හරහා ප්‍රතිචාර දක්වලා තියෙනවා මගේ චරිතයට බැනලා. සමහර වෙලාවට මම FB එකට ෆොටෝ එකක් එකතු කළත් මට බනින වෙලාවල් තියෙනවා. ඒවා දැක්කම සමහර වෙලාවට මට හිනායනවා. ඒ දේවල්වලට ඉතින් මට තරහක් නම් ඇතිවෙන්නේ නැහැ. මොකද ඒ විදියට බැනුම් අහන්නේ චරිතයට සාධාරණයක් කරන නිසා වෙන්න ඇතිනේ. කොහොමත් ප්‍රේක්ෂකයොත් දන්නවානේ මේ කරන්නේ චරිතයක් කියලා. ඔවුනුත් ඉතින් විහිළුවට බනින්නේ. ඒ හරහා ඒ අයත් විනෝදයක්නේ ලබන්නේ. ඉතින් ඒ විදියේ ප්‍රතිචාර ලබද්දි සතුටක් තමයි ඇති වෙන්නෙ මට නම්.

**• මේ නාට්‍යය කණ්ඩායමත් එක්ක යන ගමන කොහොමද?**

ඇත්තටම මට මේ ලැබුණේ ලොකු අවස්ථාවක්. මේ නිර්මාණයට සම්බන්ධ වෙන්න ලැබීම ගැන ගොඩක් සතුටුයි. මොකද ධනුෂ්ක රත්නායක කියන්නේ තරුණ පරපුරේ ඉන්න දක්ෂ නිර්මාණශීලී අධ්‍යක්ෂවරයෙක්. ඒ වගේම මෙහි තිර පිටපත් රචක මහේෂ් රත්සර මද්දුමආරච්චි කියන්නේ ඉතා දක්ෂ රචකයෙක්. මේ දෙන්නාගේ නිර්මාණයකට සම්බන්ධ වෙන්න ලැබීම ලොකු දෙයක්. ඒ වගේම මේ වෙනුවෙන් සම්බන්ධ වෙලා ඉන්නේ දක්ෂ ප්‍රවීණ රංගන ශිල්පී ශිල්පිනියන්. ඒ පිරිසත් එක්ක වැඩ කරන්න ලැබීම මට ලොකු අත්දැකීමක් වුණා. කණ්ඩායමක් විදියට ඉතා සහයෝගයෙන් හැම දෙනාම මේ වැඩ කටයුතු කරගෙන යනවා. විශේෂයෙන් කියන්න ඕනෑ මේ නිර්මාණය වෙනුවෙන් චරිත තෝරාගැනීම නිවැරදිම විදියට කරලා තියෙනවා කියලා හිතෙනවා ලැබෙන ප්‍රතිචාරවලින්ම. ඒ වගේම මහේෂ් අයියා ඒ චරිත ලස්සනට ගොඩනඟනවා. ඒ අදාළ වචන පවා අලංකාර විදියට යොදලා තියෙනවා ප්‍රේක්ෂකයන්ට රස වින්දනයක් ලබා දෙන්න. අපිට වුණත් තිර පිටපත කියවද්දීම ආසා හිතෙනවා. ඒ තරම් ලස්සන පිටපතක් අපිටත් එන්නේ. ඒ හැමදේම එක්ක හැම චරිතෙකටම අයිඩින්ටි එකක් දීලා තියෙනවා. ධනුෂ්ක අයියා ඒ පිටපත ඉතා හොඳින් අධ්‍යක්ෂණය කරනවා. ඒ හැමදේම එක්ක තමයි මේ වෙනුවෙන් සම්බන්ධ වෙලා ඉන්න හැම චරිතයකටම හොඳම ප්‍රතිචාර ලැබෙන්නේ.







**• චරිත්ගෙ අරමුණ වුණේ රංගන ශිල්පියෙක් වීමමද?**

මම පුංචි කාලේ ඉඳන්ම කලාවට ගොඩක් කැමතියි. ඒ නිසාම ඒ කාලේ කලාවට සම්බන්ධ වෙලා වැඩ කළා. මම පාසල් දෙකකට ගියා. ඒ ගාල්ල සිරිධම්ම විද්‍යාලයට සහ ගාල්ල මහින්ද විද්‍යාලයට. ඉතින් මේ පාසල් දෙකේම නාට්‍යවලට සම්බන්ධ වෙලා හිටියා. පාසල් නාට්‍ය, ළමා රාජ්‍ය නාට්‍ය උළෙලවලට, ඒ හැමදේටම සම්බන්ධ වුණා. ඒ නාට්‍ය තරග තුළින් ජයග්‍රහණ රැසක් ලබාගන්න හැකිවුණා.

හොඳම නළුවා සම්මානය පස් වතාවක් වගේ ලැබිලා තියෙනවා. 2008 වසරේ සිට වගේ නාට්‍ය උළෙලවලට සම්බන්ධ වුණේ. ඉතින් ඒ කාලෙදිත් ඕනෑ වුණේ කලාවට සම්බන්ධ වෙන්න. රංගන ශිල්පියෙක්, අධ්‍යක්ෂවරයෙක් වෙන්න ලොකු කැමැත්තක් තිබුණේ.

**• කලාව පැත්තෙන්ම ඉදිරියට යන්නද උසස් අධ්‍යාපනය කළේ?**

මම උසස් පෙළ හැදෑරුවේ කලා අංශයෙන් වුණත් නාට්‍යය හා රංග කලාව විෂයක් විදියට නම් කළේ නැහැ. මම කළේ ආර්ථික විද්‍යාව, සිංහල සහ තර්ක ශාස්ත්‍රය. ඒ තුළින් මට A සාමාර්ථයක් සහ B සාමාර්ථ දෙකක් තියෙන්නේ. ඉතින් මම විශ්වවිද්‍යාලයේ ඉගෙනගත්තේ කලාව නෙමෙයි. ටූවරිසම් මැනේජ්මන්ට් උපාධියක් තමයි මම හැදෑරුවේ. නමුත් මම ඒ අංශයෙන් ඉදිරියට යන්නේ නැතිව නැවතත් කලාවට සම්බන්ධ වුණා. ඒ මගේ වැඩි කැමැත්ත ඒ අංශයට නිසාම. පසුව මම මහරගම තරුණ සේවා සභාවෙත්, කැලණිය විශ්වවිද්‍යාලයෙත් Film and Television පිළිබඳ වැඩිදුර අධ්‍යාපනය හැදෑරුවා. එතැනින් පසුව තමයි කොළඹට නාට්‍යවලට එන්නේ.

**• දැන් කලාව දිගටම කරගෙන යාමේ සිතිවිල්ලක්ද තියෙන්නේ?**

මම ඇත්තටම කැමති කලා ක්ෂේත්‍රයේ දෙයක් කරගෙන ඉදිරියට යන්න. මම දැනටත් Black Lotus කියන වෙළඳ ප්‍රචාරණ ආයතනයේ වැඩ කරනවා. එහි කරගෙන යන්නෙත් කලාවට සම්බන්ධ දේවල්නේ. ඉතින් මේ හැමදෙයක්ම ඉගෙන ගනිමින් මේ ක්ෂේත්‍රයේ දෙයක් කරන්න තමයි හිතන්නේ දැන්. ඉතින් මගේ ආයතනයෙනුත් ලොකු සහයෝගයක් ලබාදෙනවා මේ වෙද්දි මගේ මේ වැඩ කටයුතුවලට. මම හිතනවා මට කුසලතාවක් තියෙන්නේ කලාව පැත්තට තමයි කියලා. ඒ නිසා මේ අංශයේ දේවල් ඉගෙනගෙන රංගනය, පිටපත් රචනය, අධ්‍යක්ෂණය එක්කත් හෙමින් ලස්සන ගමනක් යන්න හිතාගෙන ඉන්නවා.

**• ඔබේම නිර්මාණයන් ඉදිරිපත් කරලා තියෙනවද?**

ඔව්, මම මැතකදි පුංචි තිරයට එකතු වුණත් කලකට පෙර සිට වගේ වේදිකාවට සම්බන්ධ වෙලා හිටියා. මගේම නාට්‍ය නිර්මාණයක් කරලා තියෙනවා. මෙවර රාජ්‍ය නාට්‍ය උළෙලටත් කෙටි නාට්‍යයක් කළා 'අංකලුයි මමයි' කියලා. ඒවත් එක්කම රාජිත දිසානායක අධ්‍යක්ෂවරයාගේ අලුත්ම නිර්මාණයකටත් ප්‍රවීන රංගන ශිල්පී ප්‍රසන්නජිත් අබේසූරිය මහත්මයාගේ නිර්මාණයකටත් සම්බන්ධ වෙලා ඉන්නවා. ඒවත් එක්ක වේදිකාවේ වැඩ කිහිපයක් තියෙනවා කරගෙන යන්න. වේදිකාවේ ඒ වැඩත් එක්ක ටෙලි නිර්මාණ දෙක තුනකිනුත් ඉදිරියේදි දකින්න ලැබෙයි. මගේම නිර්මාණත් එළිදක්වන ලොකු බලාපොරොත්තුවක් තියෙනවා. ඒවා ටිකින් ටික සැලසුම් කරගෙන යනවා.

**• මේ දේවල්වලට පවුලෙන් ලැබෙන සහය කොහොමද?**

පවුලේ මම තමයි එකම දරුවා. අම්මයි, තාත්තයි මට මම කැමති විදියේ ගමනක් යන්න අද වෙනකම් ඉඩ දීලා තියෙනවා. ඒ සහයෝගය ලොකු ශක්තියක් වෙලා තියෙනවා මගේ මේ ගමනට.

ධනු විජේරත්න

# රසටම හදන්නේ පොලොස් මැල්ලුම

**කලාවට** සම්බන්ධවූ දා ඉඳලාම අද වෙනකම්ම රඟදක්වන සෑම චරිතයකින්ම ඔබේ හදවතේ ආදරණීයව ලැගුම් ගන්න හරි අපූරු චරිතාංග නිළියක් ලෙසට ඇයව හඳුන්වා දිය හැක. නිල්මිණී තෙන්නකෝන්. ආදරණීය නිල්මිණී අක්කාගේ මුළුතැන්ගෙටයි අපි අද ගියේ.
කලා කටයුතු, ව්‍යාපාර කටයුතු, දියණියගේ කටයුතු, නිවසේ කටයුතු දහසකුත් එකක් වැඩ රාජකාරී මැද්දේ ලැබුණ පුංචි වෙලාවකදී අපි කතා කළෙමු.

**• රංගන ශිල්පිනියක්, ව්‍යාපාරිකාවක්, මවක්, නිවේදිකාවක්, ගෘහණියක්... සැබෑ ජීවිතයේදී පණ පොවන මේ චරිතවලින් වඩාත් කැමැති චරිතය?**
අම්මාගේ චරිතයට මම ගොඩක් ආසයි. මගේ දෝණිත් හරිම ආසයි මේකප් රිමූ කරලා එයා ළඟට ගියාම. මේ ලෝකයේ ගැහැනියක් ලබන උත්තරීතර ඔටුන්නනේ මව් පදවිය. යුතුකම්, වගකීම්, ආදරය. සෙනෙහස පිරුණු මේ පදවියට මම ගොඩක් ආදරෙයි.

**• ගෙදර ඉන්න දවසට ඔබ අතින්ද සියලු වැඩ කෙරෙන්නේ?**
ඔව්. නිවසේ හිටියත් නැතත්, සියලු වැඩ සැලසුම් කෙරෙන්නේ මගේ අතින්. නිවසෙන් පිටදී මොනතරම් කාර්යය බහුල වුණත්, නිවසේ රැඳෙන වෙලාවට ඒ හැමදේම මම හරිම සතුටින් කරනවා.

**• වැඩ රාජකාරිවලට කාලය බාධාවක් නොවේද?**
දිනකට පොදුවේ අපි හැමෝටම තියෙන්නේ පැය 24යි. උදෑසන අවදිවීම, කලින් වැඩ සැලසුම් කිරීම, වෙලාවට වැඩ කිරීම කියන කාරණා එක්ක කාලය නෑ කියලා ප්‍රශ්නයක් නම් මතුවෙලා නෑ.

**• ඉස්සර ඉඳලාම රසට උයන්න පුළුවන්ද?**
අපෝ බෑ. බැඳලා එනකොට පපඩමක්වත් බැදගන්න බෑ. ඊට පස්සෙ තමයි ටික ටික උයන්න පුරුදු වුණේ. දැන් නම් ඕනෑම කෑමක් රහට උයන්න පුළුවන්.

**• කොහොමද ඔච්චර හොඳට උයන්න ඉගෙන ගත්තේ?**
ඉස්සර ස්වර්ණවාහිනියෙන් විකාශය කළ 'ලියසෙවන' වැඩසටහන ඉදිරිපත් කරන කාලෙදි මට ලංකාවේ නම් දැරූ සූපවේදීන් ඉවුම් පිහුම් කරන හැටි දැසින්ම දැක ගන්න ලැබුණා. ජීවිතයට ලැබුණු ඒ අපූරු අත්දැකීමෙන් මම දක්ෂ ඉවුම් පිහුම් දන්න අම්මා කෙනෙක් වුණා. ඇත්තටම ඉවුම් පිහුම් කියන්නෙත් කලාවක්. රඟපෑමක් කරලා ඒක ආපහු දකිද්දී හිතට සතුටක් දැනෙනවා වගේම, කෑමක් උයලා රස විඳිනකොට අමුතුම දෙයක් හිතට දැනෙනවා.

**• ඔබ හදන කෑමවලින් දියණිය ආසාවෙන්ම කන්නේ මොනවාද?**
චීස්, ඔලිව් වැඩිපුර දාලා මම හදන මැකරෝනි, පැස්ටා වර්ග කන්න නම් ඇය ගොඩක් කැමතියි. ඊට අමතරව මම රාත්‍රී ආහාරයට හැමදාම හදන පෝෂණයෙන් ඉහළ එළවළු සලාදයටත් ඇය බොහොම ප්‍රියයි.

**• හැමදාම රාත්‍රියට සලාදයක් එක්කර ගන්නවාද?**
ඔව්. පිෂ්ටය අධික බත්, පාන්, පිටි සහිත අනෙකුත් කෑම ආහාරයට ගන්නේ හරිම අඩුවෙන්. රෑ කෑමට බොහෝ විට කැරට්, පිපිඤ්ඤා, නෝකෝල්, කොත්තමල්ලි කොළ, බ්‍රොකෝලී, ඔලිව් ඇට, ඔලිව් තෙල් දාලා හදන සලාදයක් තමයි කෑමට ගන්නේ. අවශ්‍ය නම් බිත්තර, මස්, මාළු තම්බලා පොඩි ප්‍රමාණයක් ගන්නවා. මේ වගේ කෑම ශරීර සෞඛ්‍යයට ඉතාම ගුණදායකයි වගේම හමටත් හරිම හිතකරයි.

**• කෑම ගැන ඔබ ගොඩක් සැලකිලිමත් වෙනවා වගෙයි.**
අපොයි ඔව්. අපි මොන දේ කරන්නෙත් කාලා බීලා සතුටින් ඉන්නනේ. ඒ නිසා කෑම නිසා සෞඛ්‍යයට හානියක් කර ගන්න හිතන්නේ නෑ. උදෑසන ආහාරයටත් මම බොහෝ විට ගන්නේ බිත්තර දෙකක් එක්ක අලිගැටපේර ගෙඩියක්. දවල්ටත් බත් හරිම අඩුවෙන් ගන්නේ. එළවළු, පලතුරු, පලා වර්ග වැඩිපුර එකතු කරගන්නවා දවල් කෑමට.

**• ගමේ කෑමවලට ආසද?**
හරිම ආසයි. දුවයි, අම්මත් ආස නිසා නිතර අපේ ගෙදර හැදෙන්නේ ගමේ ගොඩේ කෑම වර්ගම තමයි. වස විස නැතුව කන්න තියෙන්නෙත් දැන් ඒවනේ.

**• කෑම හදනකොට මොන වගේ දේවල් ගැනද සැලකිලිමත් වෙන්නේ?**
මම හරි ආසයි දුවයි, මගේ අම්මයි කැමති කෑම වර්ග නිතර හදන්න. මොකද මොන තරම් රාජ භෝජනයක් වුණත් ගෙදර අය අකමැතිනම් හදලා වැඩක් නැනෙ. ඒ නිසා මම එයාලා ආසම කෑම රසට උයලා දෙන්න කැමතියි. ඊට අමතරව ඉතිං උයන වෙලාව ව්‍යාංජන ගැලපීම ගැන උපරිමයෙන්ම හිතනවා. ශරීරයට අහිතකර ඒවා කන්නෙත් නෑ.

**• උයන වෙලාවට කවුරු උදව් කරනවාටද කැමති?**
උදව් නොකළත් මං ආසයි දුව, මං උයනකම් කුස්සියට වෙලා වාඩි වෙලා ඉන්නවාට.

**• පාළුව, කාන්සිය යන්න රේඩියෝව අහන්න, TV බලන්න පුරුදුවෙලා ඉන්නවාද උයනකොට?**
සිංදුවක් අහගෙන තමයි මම උයන්නේ. පුරුද්දක් විදිහට උදෑසන 11ට සම්බුද්ධ පූජාව පූජා කරන නිසා ඒ වෙලාවට බෞද්ධ වැඩසටහන් දනවා. මම නිවසේ නැතත් උදෑසන, දහවල් සුපුරුදු චාරිත්‍රවලට අනුව බුද්ධ පූජාව පූජා කරනවා.

**• ඔබ හදන කෑමක් හැමෝම රස කර කර කනකොට මොන වගේ හැඟීමක්ද හිතට දැනෙන්නේ?**
අම්මෝ ඒ හැඟීම නම් වචනයෙන් විස්තර කරන්න බෑ. එහෙම දකිනකොට තව තවත් රසට කෑම හදලා කන්න දෙන්න හිතෙනවා. මගේ දුව හැමදාම කෑම මේසයෙන් නැගිටින්නේ "ඔයාට ගොඩක් ස්තුතියි අම්මා..." කියලා. ඒ පුරුද්ද ඇය දිනපතාම කරනවා. ඒ වචන ටික ඇහෙනකොට, උයනකොට දැනෙන මහන්සිය කොහෙන් ගියාද නෑ.

**• අතීතයේ මුළුතැන්ගෙයි කළ චාරිත්‍ර වාරිත්‍ර ගැන ඔබ අදටත් හිතනවාද?**
කාලයේ තාලයට බොහෝ දේ මුළුතැන්ගෙයි වෙනස් වෙලා. වැඩ පහසු කරන ක්ෂණිකව භාවිත කරන උපකරණ ආදිය මුළුතැන්ගෙයි කටයුතු පහසු කරලා තියෙන්නේ. නමුත් එද ඉඳලා අද දක්වා මුළුතැන්ගෙයි පිරිච්ච බව වෙනුවෙන් මමත් බොහෝ දේ අනුගමනය කරනවා. පිළිවෙළ පිරිසිදුකම අංක එක. අනිත් දේ තමයි හාල් ටික ලිපේ තියලා තුන් සැරයක් බත් මුට්ටිය අල්ලලා වඳිනවා. රයිස් කුකර් පාවිච්චි කළත් ඒ චාරිත්‍රය කෙරෙනවා. ඒ තුන් සැරයක් වැඳීමෙන් සංකේතවත් කරන්නේ බත සැපයූ ගොවීන්ට පින් දීම. එවැනි චාරිත්‍ර අදටත් දෙහොත් මුදුනින් පිළිගන්නවා. අනිත් දේ තමයි රඟපෑමෙන් හම්බ කළත්, සැලෝන් එකෙන් හම්බ කළත්, මා කුසගින්නට බත් වේලක් කන්නේ ඒ වෘත්තීන් දෙකටම සම්බන්ධ සියලු දෙනා නිසා. බත්පත අතට ගත්තාම ඒ හැමෝටම ස්තුතිවන්තව පින් දෙනවා.

**• දියණියට මුළුතැන්ගෙයි කටයුතු හුරුකළ යුතුයි කියා ඔබ විශ්වාස කරනවාද?**
ඔව්. දියණියක මුළුතැන්ගෙයි කටයුතු දැන සිටීම ඇයගේ අනාගතයට අත්වැලක්. වසංගතය නිසා රට වහල තිබුණ කාලේදී වෙනදාට වඩා වැඩි කලක් මට දුව එක්ක ඉන්න ලැබුණා. ඒ කාලෙදි ඇයත් එක්ක එකතු වෙලා මම, එක එක කෑම ජාති හද හද රස බැලුවා. සමහර ඒවා හරි ගියා, සමහර කේක් වර්ග එහෙම වැරදුනා. වැරදුනත් ඒ තුළින් අපි දෙන්නා හරිම සතුටක් වින්ද.

**• රසටම හදන කෑමක් මතක් කළොත්?**
පොලොස් මැල්ලුම රසට හදනවා. ඒක හදන්නේ පොලොස් ඉස්සෙල්ලම කහයි, ලුණුයි, පොඩි ගොරකා කෑල්ලකුයි දාලා හොඳට තම්බ ගන්නවා. ඊට පස්සේ වතුර බේරලා අරන් වංගෙඩියේ දාලා හොඳට කොටනවා. ඊට පස්සේ ලූණු, ගම්මිරිස්, රම්පේ, කරපිංචා, ඉඟුරු, සුදුලූණු හොඳට කොටලා ඒ ටික පැත්තකින් තියනවා. තෙල් ටිකක් රත්වෙන්න වළඳක තියලා අර තලාගත්ත තෙම්පරාදුවේ ටික දානකොට පොඩියට කපාගත්ත වේළිච්ච මිරිස් කරල් කිහිපයකුත් දනවා. ඒ ටික හොඳට බැදෙනකොට අර තලා ගත්ත පොලොස් ටික දනවා. කැමතිනම් ගාගත්ත පොල් ටිකකුත් එකතු කරනවා. හදලා බලන්නකෝ. හරිම රසයි.

**• උයන එක වදයක් විදිහට දැනිලා නැද්ද?**
නැහැ. කවදවත් නෑ. මම හරිම ආසාවෙන් ඒ දේ කරන්නේ. නිවසක පැවැත්මට මවගේ ආදරය, සෙනෙහස වගේම පෝෂණයත් හරිම වැදගත්. ඒ හැමදේම මම හොඳින් තේරුම් අරන් ඉන්නේ.

**• සතුන්ටත් කෑම ඔබ අතින් පිළියෙළ වෙනවද?**
ඔව්. ගෙදර සුරතලේට හදන පූසාට වෙනම කෑම හදනවා. කුරුල්ලන්ටත් හැමදාම කෑම දනවා. සතෙකුට කෑම ටිකක් දැම්මත් ඒවා පිළිවෙළට දෙන්න ඕනේ.

**• ඉවුම් පිහුම් කටයුතු කරනකොට ඔබේ රුව ආරක්ෂා කර ගැනීම වෙනුවෙනුත් යම් යම් දේවල් කරනවාද?**
අපොයි ඔව්. උයන වෙලාවට ගොඩක් වතුර බොනවා. ඊට අමතරව සීනි අඩුවෙන් දාපු පලතුරු යුෂ වීදුරුවකුත් බොන්න පුරුදු වෙලා ඉන්නවා. ඊට අමතරව උයනකොට කෑමවල ලුණු බලන්නේ එකම එක සැරයයි. සැරෙන් සැරේ ලුණු බලනකොට ඇඟ මහත් වෙනවා.



## නිල්මිණී තෙන්නකෝන්

අසුන්තා එදිරිසූරිය
සිතුවම: සමන් කළුබෝවිල

